මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

# වාර්ෂික වාර්තාව

# 2020

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

## ආයතනික පසුබිම

| | | |
|---|---|---|
| ආයතනය | : | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| අමාත්‍යාංශය | : | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| ලිපිනය | : | 354/2, 7 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | : | director.nhrdc@yahoo.com |
| වෙබ් අඩවිය | : | www.nhrdc.gov.lk |
| දුරකථන අංකය | : | 0112595680 |
| ෆැක්ස් | : | 0112595680 |
| විගණකවරු | : | විගණකාධිපති<br>ජාතික විගණකාධිපති කාර්යාලය<br>බත්තරමුල්ල |
| බැංකුකරුවන් | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව |

## දර්ශනය

“අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්”

## මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නවාකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## අගයන්

- සාමූහිකත්වය
- නිර්මාණශීලිත්වය
- පාරිභෝගික නැඹුරුතාව
- සමානාත්මතාව

# සභාපතිතුමාගේ ප්‍රකාශය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිණිස වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම උදෙසා 1997 අංක 18 දරණ ජාතික මානව සම්පත් සංවර්ධන සභා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ආයතනයකි. එහි ප්‍රධාන පරමාර්ථය වන්නේ අදාළ අමාත්‍යවරයාට සහ රජයට මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හා උපදෙස් ලබා දීමයි.

රට තුල ශ්‍රම වෙළඳපල ගැටළු කෙරෙහි COVID-19 බලපෑම හඳුනාගැනීමේ අරමුණින්, සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තය, ඉදිකිරීම් කර්මාන්තය, විදේශ රැකියා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ඇඟලුම්, සැපයුම් කළමනාකරණය, ගුවන් සේවා සහ උප අංගයන්ගෙන් යුතු තොරතුරු තාක්ෂණ, නෛතික, අධ්‍යාපනික සහ මූල්‍ය යන ආර්ථික වශයෙන් වඩාත් සංවේදී අංශ සම්බන්ධයෙන් මාර්ගගත සමීක්ෂණයක් සිදු කරන ලදී. සමීක්ෂණයට අනුව නිර්දේශ ඉදිරිපත් කර අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් අදාළ පාර්ශවකරුවන්ගේ තොරතුරු පරතරය සපුරාලීම සඳහා වාර්ෂිකව සංඛ්‍යාන අත්පොතක් සහ මානව ප්‍රාග්ධන සඟරාවක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව 2020 නවතම අත්පොත සහ මානව ප්‍රාග්ධන සඟරාව අප සභාවේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

රටේ පවතින තත්ත්වය මත රජය විසින් නව බඳවා ගැනීම් අත්හිටුවා තිබූ අතර 2020 වර්ෂය තුළ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) හා සංවර්ධන නිලධාරී තනතුරු 03ක් පුරප්පාඩු වී ඇත. පනතේ මූලික ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින්නේ එක් සහකාර අධ්‍යක්ෂවරයෙක්, පර්යේෂණ නිලධාරීන් හතර දෙනෙක් සහ එක් සංවර්ධන නිලධාරියෙක් පමණි. එමෙන්ම 2020 වර්ෂය සභාවේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස පද්මසිරි ජයමාන්න මහතා 2020.06.22 දින සිට පත් කරන තෙක් කිසිවෙක් පත් කර නොතිබුණි. එහෙත් 2020.11.16 දින එතුමා හදිසියේ අභාවප්‍රාප්ත වී ඇති අතර 2020.12.31 දිනට එම තනතුර නැවතත් පුරප්පාඩු වී පැවතුණි.

ඒ අතරම, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අන්තර් පළාත් ප්‍රවාහන සීමාවන් පැනවීම නිසා සභාවේ බොහෝ නිලධාරීන් නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ආයතනයේ ඵලදායී සේවා සැපයීම සාක්ෂාත් කර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග අතර, අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන පරිදි නිවසේ සිට සේවය කිරීමේ සංකල්පය යොදා ගැනීම, සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම, විවිධ පාර්ශවකරුවන් සහ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව කාර්ය මණ්ඩලය සමඟ Zoom App තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පැවැත්වීම, ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා Zoom තාක්ෂණය ඔස්සේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම දැක්විය හැක.

කෙසේ වෙතත්, මෙම අභියෝග මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව නව අත්දැකීම් වලට නිරාවරණය කරමින් වඩාත් ශක්තිමත් කරවීය. මේ අර්බුදකාරී තත්ත්වය තුළ අප සභාව රටට සාධනීය දායකත්වයක් ලබාදෙන බව අපගේ විශ්වාසයි. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව අභියෝග මධ්‍යයේ ඔබට විශ්වාසය තැබිය හැකි ශක්තිමත් ආයතනයක් ලෙස දිගු කල් පවතිනු ඇත.



සභාපති

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

# පටුන


1.ආයතනික පසුබිම හා විෂය පථය ..... 1

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය ..... 4

3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන ..... 6

4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු: ..... 7

5. 2020 වර්ෂයේ සිදු කරන ලද ව්‍යාපෘති ..... 11

5.1 ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (NHRDP) සැකසීම ..... 11

5.2 ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිකයින්ට COVID-19 වසංගතයෙහි ආංශික බලපෑම පිළිබඳ සමීක්ෂණය ..... 14

5.3 දේශීය කර්මාන්තයන්හි වත්මන් තත්වය හා ඒ ආශ්‍රිත මානව සම්පත් ගැටළු : ..... 18

5.3.1 බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්තය ..... 18

5.3.2 පිත්තල කර්මාන්තය ..... 20

5.3.3 සමුද්‍ර, මිරිදිය සහ ජලජීවී වගාව, ඉස්සන් ගොවිතැන සහ විසිතුරු මත්ස්‍ය වගාව ..... 23

5.3.4 වී වගාව ..... 26

5.3.5 බඩඉරිඟු වගාව ..... 27

5.3.6 කිතුල් වගාව ..... 29

5.3.7 සමෘද්ධි සංවර්ධන වැඩසටහනේ පවතින තත්ත්වය ..... 31

5.3.8 ශ්‍රී ලංකාවේ සමුපකාර සංවර්ධනය පිළිබඳ තත්ත්ව වාර්තාව ..... 36

5.5 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංඛ්‍යාන අත්පොත ..... 43

6. 2020 වර්ෂය තුළ පළ කරන ලද ප්‍රකාශන - ..... 43

7. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ..... 44

8. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය ..... 46

9. ශුද්ධ වත්කම්/ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය ..... 47

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය ..... 48

11. සටහන් ..... 50

12. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වල සාරාංශයකින් ..... 57

සමන්විත සටහන් ..... 57

13.විගණන වාර්ථාව ..... 60

# 1.ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනයෙහිලා සියලු කටයුතුවලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමටත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි ප්‍රධාන පරමාර්ථය වන්නේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හා උපදෙස් අදාළ අමාත්‍යවරයාට සහ රජයට ලබා දීමයි.

## 1.1ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. එතැන් සිට කෙටි කාලයක් තුළදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී එය අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතටද ඉන්පසු නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයේද, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේද පාලනයට නතු විය. මෙසේ කෙටි කාලයක් තුළ අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කළ මෙම ආයතනය, වර්තමානයේදී රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යයි.

### 1.2 දර්ශනය

‘‘අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්‘‘

### 1.3 මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## 1.4 අරමුණු

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණු වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි.

සභා පනතේ 14(1) වගන්තියට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත පරිදි වේ. පහත දැක්වෙන කාරණාවලට එනම් -

i. (අ) රැකී රක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය
   (ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම
   (ඇ) ජීවන තත්වය නංවාලීම
   (ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ
   (ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් ඛණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශවලින් අමාත්‍යවරයාට උපදෙස් දීම

ii. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

iii. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට, සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

iv. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම

v. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ

vi. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියලු ක්‍රියා සිදුකිරීම

**1.5 සභාව සතු බලතල**

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාළව කාරණා සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතුවල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු, විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභාවලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට. සහ

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියලු පියවර ගැනීමට.

## 2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ විධිවිධාන යටතේ පත්කළ සභාපති සහ සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ඔවුන් අතරින් පහළොස් දෙනෙකු (15) නිල බලයෙන් පත් කරනු ලබන අතර ඉතිරි සාමාජිකයින් පස් දෙනා (5) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. අදාළ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ කුසලතා සලකා එම සාමාජිකයින් පස්දෙනා පත් කර ඇති අතර ඉන් දෙදෙනෙකු (2) පෞද්ගලික අංශයේ අය වෙති. කෙසේ වෙතත්, නිල බලයෙන් පත්වන සාමාජිකයින් සංඛ්‍යාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44, 45 සහ 47 ව්‍යවස්ථාවන්ට යටත් වේ. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් අතරින් එක් සාමාජිකයෙක් සභාපතිවරයා ලෙස පත්කිරීමට පනත යටතේ ඇමතිවරයාට බලය ඇත. සභාපතිවරයා සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වේ. 2020.12.31 දින වනවිට සාමාජිකයන් 18 දෙනෙකුගෙන් සමන්විත විය. 2020.12.31 දිනට සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**පනතේ 3(1) (අ) සිට (ව) දක්වා වගන්ති යටතේ කර ඇති පත්වීම්**

1. පද්මසිරි ජයමාන්න මහතා, සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
2. එම්.පී.ඩී.යූ.කේ. මාපා පතිරණ මහතා, ලේකම්, කම්කරු විෂය භාර අමාත්‍යාංශය
3. මහාචාර්ය කපිල පෙරේරා මහතා, ලේකම්, උසස් අධ්‍යාපන හා තාක්ෂණය විෂය භාර අමාත්‍යාංශය
4. ජේ.ජේ. රත්නසිරි මහතා, ලේකම්,රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය
5. වෛද්‍ය, මේජර් ජෙනරාල් (විශ්‍රාමික), එස්.එච්. මුණසිංහ මහතා, ලේකම්, සෞඛ්‍යය විෂය භාර අමාත්‍යාංශය
6. ඩබ්. ඒ. වූලානන්ද මහතා, ලේකම්, කාර්මික සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය
7. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මහතා, ලේකම්, කෘෂිකාර්මික විෂය භාර අමාත්‍යාංශය
8. අනුරාධ විජේකෝන් මහතා, ලේකම්, තරුණ කටයුතු විෂය භාර අමාත්‍යාංශය
9. මහාචාර්ය දයන්ත විජේසේකර මහතා, සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
10. ජානක ජයලත් මහතා, අධ්‍යක්ෂ ජෙනරාල් (වැ.බ.), තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
11. මහාචාර්ය හරිශ්චන්ද්‍ර අබේගුණවර්ධන මහතා, සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
12. මහාචාර්ය සම්පත් අමරතුංග මහතා, සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
13. තරංග නලීන් ගම්ලත් මහතා, සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
14. ජේ.ජී.ඩී. සේනානායක මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජිත, මුදල් විෂය භාර අමාත්‍යාංශය

**පනතේ 3 (2) (ග) වගන්තිය යටතේ පත්කිරීම්**

1. පී. රණේපුර මහතා (පත්කල සාමාජික)
2. නීතීඥ මහේෂ් කොටුවැල්ල මහතා (පත්කල සාමාජික)
3. විශේෂඥ වෛද්‍ය චතුරංග කැප්පෙටියාගම මහතා (පත්කල සාමාජික)
4. ආචාර්ය රනාලි පෙරේරා මිය, ඛණිජ තෙල් පිළිබඳ විශේෂඥ (පත්කල සාමාජික)

**2020 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත් වූ දිනයන් හා සහභාගී වූ සාමාජිකයන් පිලිබඳ විස්තර -**

| # | පාලක මණ්ඩල සාමාජිකයා සහ ආයතනය | 16.07.2020 | 29.09.2020 |
|---|---|---|---|
| 01. | සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | √ | √ |
| 02. | ලේකම්, උසස් අධ්‍යාපන හා තාක්ෂණය විෂය භාර අමාත්‍යාංශය | √ | |
| 03. | ලේකම්, අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය | √ | √ |
| 04. | ලේකම්,කම්කරු විෂය භාර අමාත්‍යාංශය | √ | * |
| 05. | ලේකම්,රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය | * | * |
| 06. | ලේකම්, සෞඛ්‍යය විෂය භාර අමාත්‍යාංශය | √ | √ |
| 07. | ලේකම්, කාර්මික සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය | √ | - |
| 08. | ලේකම්,කෘෂිකාර්මික විෂය භාර අමාත්‍යාංශය | - | √ |
| 09. | ලේකම්, තරුණ කටයුතු විෂය භාර අමාත්‍යාංශය | √ | √ |
| 10. | සභාපති,තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | √ | √ |
| 11. | අධ්‍යක්ෂ ජෙනරාල්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | √ | √ |
| 12. | සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | √ | * |
| 13. | සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | √ | √ |
| 14. | සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | √ | √ |
| 15. | නියෝජිත, මුදල් විෂය භාර අමාත්‍යාංශය | √ | √ |
| 16. | පී. රණේපුර මහතා (පත්කල සාමාජික) | √ | √ |
| 17. | නීතිඥ මහේෂ් කොටුවැල්ල මහතා (පත්කල සාමාජික) | √ | √ |
| 18. | විශේෂඥ වෛද්‍ය චතුරංග කැප්පෙටියාගම මහතා (පත්කල සාමාජික) | √ | √ |
| 19. | ආචාර්ය රනාලි පෙරේරා මිය (පත්කල සාමාජික) | √ | √ |
| | **සහභාගී වූ මුළු සංඛ්‍යාව** | **17** | **14** |

**සටහන :**

√ - සහභාගී වී ඇත.

*ලේකම්වරයාගේ කාර්යබහුලත්වය මත අතිරේක ලේකම්වරයා/ උප සභාපතිවරයා සහභාගී වී ඇත.

- පැමිණ නැත.

## 3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන



**4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු:**

| තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | **2020.12.31** දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | **2020.12.31** දිනට පුරප්පාඩු සංඛ්‍යාව | නම |
|---|---|---|---|---|
| සභාපති | 01 | - | 01 | - |
| අධ්‍යක්ෂ | 01 | 01 | - | කේ.ඒ ලලිතධීර මහතා |
| සහකාර අධ්‍යක්ෂ | 03 | 02 | 01 | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>එස්.එස්. කළුආරච්චි මිය |
| සභා ලේකම්/නීති නිලධාරි | 01 | 01 | - | ජී.ජී. කසුනි උත්පලා මෙනවිය |
| පර්යේෂණ නිලධාරි | 04 | 04 | - | ඩී.සෙන්තිල්නාදන් මහතා<br>එන්.ඩී එදිරිසිංහ මෙනවිය<br>ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා<br>යූ.එම්. වීරසේන මෙනවිය |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - | කේ.වී.එස්. එරංගා මිය |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | - |
| සංවර්ධන නිලධාරි | 04 | 01 | 03 | කේ.පී.පී. පෙරේරා මහතා |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 01 | - | 01 | - |
| කළමනාකරණ සහකාර | 08 | 06 | 02 | සී.ආර්. මද්දගේ මහතා<br>එම්.ජී.එන්. දිල්හාරි මිය<br>කේ.සී මුතුමාල මෙනවිය<br>ජී.එම් සද්ධාමංගල මිය<br>ආශා සුරේනි එදිරිසිංහ මිය<br>හිරුණි චමෝදි මෙනවිය |
| රියැදුරු | 04 | 04 | - | ජී.එම්. පින්නදූව මහතා<br>ටෙරන්ස් පියල් මහතා<br>ආර්.සී.ආර්. ජයවර්ධන මහතා<br>ගයාන් ජීවන්ත මහතා |
| කාර්යාල සහායක | 04 | 03 | 01 | එන්.ජී. නදුන් මධුරංග මහතා<br>ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා<br>ඒ. නයනා ප්‍රියදර්ශනී මෙනවිය |
| **මුළු එකතුව** | **33** | **23** | **10** | |

**4.1 නව බඳවා ගැනීම්**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව අප සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 33 දෙනෙකු වන නමුදු 2020.12.31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 23 දෙදෙනකු විය. රජය මගින් බඳවා ගැනීම් නතර කර තිබූ බැවින් 2020 වර්ෂයේදී කිසිඳු බඳවාගැනීමක් සිදු නොවුණු අතර 2020.06.22 දින සිට නව සභාපති/ප්‍රධාන විධායක නිලධාරි ලෙස පද්මසිරි ජයමාන්න මහතා පත්කර තිබූ අතර 2020.11.16 දින එතුමා හදිසියේ අභාවප්‍රාප්ත වූ බැවින් 2020.12.31 දින දක්වා එම තනතුර ඇබෑර්තුව පැවතුණි.

**4.2 සේවයෙන් ඉල්ලා අස්වීම් :**

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| 1.එස්.ටී. තනිගසිලන් මයා | සහකාර අධ්‍යක්ෂ(පර්යේෂණ) | 2020/10/31 |

**4.3 2021 වර්ෂයේදී වැඩ ආවරණ/වැඩ බැලීම සඳහා සභාව විසින් පත්කළ නිලධාරීන් :**

| නම | තනතුර | පත්කළ දිනය |
|---|---|---|
| 1.ජේ.ඒ. සී.පී. ජයසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ (වැ.බ) | 02.11.2020 |

### 4.4 දේශීය පුහුණුව

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින්, සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ට දේශීය පුහුණුව ලබා දෙන ලදී. 2020 වර්ෂය තුළ පුහුණුවට සහභාගී වූ නිලධාරීන්ගේ විස්තර පහත පරිදි වේ.

| නම | තනතුර | පාඨමාලා/පුහුණු වැඩසටහනේ නම | ආයතනය |
|---|---|---|---|
| කසුනි උත්පලා මහත්මිය | නීති නිලධාරි/සභා ලේකම් | Corporate Writing | RH පුහුණු සහ සංවර්ධන ආයතනය. |
| සුජීවා කළුආරච්චි මිය<br>නදීෂා දිල්හාරි මිය<br>කේ.සී. මුතුමාල මිය | සහකාර අධ්‍යක්ෂ(මුල්‍ය.)<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා සැකසීම/ අවසාන ගිණුම් සකස් කිරීම-රාජ්‍ය අංශය | ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය |
| ආචාර්ය කේ.ඒ.ලලිතධීර මයා<br>ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>කසුනි උත්පලා මිය<br>සුජීව කළුආරච්චි මිය<br>ඩී.සෙන්තිල්නාදන් මහතා<br>එන්.ඩී.එදිරිසිංහ මෙනවිය<br>යූ.එම්.වීරසේන මෙනවිය<br>ජී.පී.එම්.සද්ධම්ංගල මිය<br>එච්.එච්.වමෝදි මෙනවිය | අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ(සං.)<br>නීති නිලධාරි/සභා ලේකම්<br>සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය)<br>පර්යේෂන නිලධාරි<br>පර්යේෂන නිලධාරි<br>පර්යේෂන නිලධාරි<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | සංයුක්ත සැලැස්ම සකස් කිරීම | ආචාර්ය සමන්ත රත්නායක මයා, PIM ආයතනය |
| නයනා ප්‍රියදර්ශනී මෙනවිය<br>ගයාන් ජීවන්ත මහතා | කා.කා.ස.<br>රියැදුරු | ආතතිය සහ කෝපය ජය ගැනීමට සහ එමඟින් අපගේ ජීවිතය වෙනස් කිරීමට අභියෝග කිරීම සඳහා ප්‍රබල ප්‍රකාශන ප්‍රතිකාරයක් ලෙස සංගීතය යොදා ගැනීම | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |

## 4.5. විගණන හා කළමනාකරණ කමිටුව

2020 වර්ෂයේ දී, විගණන හා කළමනාකරණ කමිටුව එක් අවස්ථාවක රැස් වූ අතර පහත කරුණු සම්බන්ධයෙන් කළමණාකරණ තීරණය සභාවට නිර්දේශ කරන ලදී.

- පනතට අනුකූල වන සංශෝධිත සංයුක්ත සැලැස්ම සකස් කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම
- සංශෝධිත පුහුණු ප්‍රතිපත්තිය සහ ආයතනික ව්‍යුහය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීමට උපදෙස් දීම
- විගණකාධිපති වාර්තාව 2019 සමාලෝචනය
- 2020 සහ 2021 අයවැය සමාලෝචනය
- ක්‍රියාකාරී සැලැස්ම 2020 සහ 2021 සමාලෝචනය
- මූල්‍ය ප්‍රකාශන 2020 සමාලෝචනය
- සභාවේ පරිපාලනයට අදාළ විවිධ කළමනාකරණ තීරණ

2020 ජූලි 16 සිට දෙසැම්බර් 31 දක්වා විගණන සහ කළමනාකරණ කමිටුව සභාවේ පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

1. ජේ.ඩී.ජී. සේනානායක මිය - (නියෝජ්‍ය අධ්‍යක්ෂ – විදේශ සම්පත් දෙපාර්තමේන්තුව) - කමිටු සභාපති
2 ආර්. එච් පියසේන මහතා - (සභා සාමාජික ) - කාරක සභික
3. ඕ.පී.ආර්. දමයන්ති මිය (ප්‍රධාන අභ්‍යන්තර විගණක, අමාත්‍යාංශය) - නිරීක්ෂක
4 එම්.ඒ.එස්. පුෂ්පරාණි මිය - (රජයේ විගණන අංශය ) - නිරීක්ෂක

# 5. 2020 වර්ෂයේ සිදු කරන ලද ව්‍යාපෘති

## 5.1 ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (NHRDP) සැකසීම

1997 අංක 18 දරන ජාතික මානව සම්පත් සංවර්ධන සභා පනතේ 14(i) වගන්තිය ප්‍රකාරව, සභාවේ වගකීම් සහ කාර්යයන් වනුයේ සේවා නියුක්තිය, පුහුණුව සහ අධ්‍යාපනය සම්බන්ධ හෝ ඊට අදාළ ආංශික මානව සම්පත් සංවර්ධනය තාර්කිකකරණය සහ සම්බන්ධීකරණය, විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම, ජීවන තත්ත්වය ඉහළ නැංවීම, අවාසි සහගත පුද්ගල කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණය සැලසුම් කිරීම; සහ ආර්ථික ප්‍රතිසංස්කරණ සමඟ හිමිකම් පවත්වා ගැනීම ඇතුළුව ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට එහි සෑම අංශයකින්ම උපදෙස් ලබා දීමයි.

රජයේ නව දැක්ම යටතේ ආවරණය වන විෂය ක්ෂේත්‍රය අනුව ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ සමඟ සමපාත වන පරිදි ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම වහා අවශ්‍ය වේ. ඒ අනුව, ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ යටතේ එන ප්‍රධාන ප්‍රතිපත්ති දහය සඳහා වගකිව යුතු සෑම ආයතනයකම එකඟතාවය ඇතිව මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම ආරම්භ කොට ඇත.

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි ඉලක්ක/අරමුණු :**

**සේවා නියුක්තිය**

1. ශ්‍රී ලංකාවේ සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා පූර්ණ, ඵලදායී සහ නිදහසේ තෝරාගත් රැකියාවක් ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීම

2. ඒක පුද්ගල ආදායම වැඩි කිරීම සහ දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහනය අඩු කිරීම තුළින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම

3. භේදයකින් තොරව සෑම සේවකයෙකුටම හැකි උපරිම රැකියා අවස්ථා ලබාදීම.

**අධ්‍යාපනය සහ පුහුණුව**

1. ඉහළ නිපුණතාවයන් සහිත, ගෝලීය වශයෙන් තරඟකාරී, බහු නිපුණතා සහ ඵලදායී ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම

2. දූෂණයෙන් තොර අධ්‍යාත්මිකව දියුණු, පරිසර හිතකාමී සහ සදාචාර සම්පන්න සමාජයක් ඇති කිරීම.

3. ළමුන් සහ තරුණයින් හානිකර මත්ද්‍රව්‍ය වලින් ආරක්ෂා කිරීම සඳහා නිසි නිරීක්ෂණ සහ පරීක්ෂණ යාන්ත්‍රණයක් සහතික කිරීම.

**ජනතා - කේන්ද්‍රීය ආර්ථිකය :**

1. වර්තමාන සහ අනාගත පරම්පරාවේ යහපත සඳහා ආර්ථික සංවර්ධනයේ සාකල්‍ය ප්‍රවේශයක් නිර්මාණය කිරීම
2. ආර්ථික ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**සමාජ ආරක්ෂණය සහ හිමිකම් :**

1. කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන්, වෙනස් හැකියාවන් ඇති සහ අවාසි සහගත කණ්ඩායම්වල මූලික අයිතිවාසිකම් සහ අවශ්‍යතා සුරක්ෂිත කිරීම.
2. සයිබර් හිරිහැර කිරීම් වලින් පුරවැසියන්ගේ ආරක්ෂාව සහතික කිරීම.

**විද්‍යා තාක්ෂණය සහ නවෝත්පාදන :**

1. තාක්ෂණය මත පදනම් වූ සමාජයක් සඳහා ශ්‍රී ලංකාවේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම
2. ආන්තික ප්‍රජාවන් සහ අවදානමට ලක්විය හැකි පරිශීලකයින් සඳහා ඩිජිටල් සේවා සැපයීම සහතික කිරීම (ආබාධිත පුද්ගලයින් වැනි)
3. නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ ඉහළ ඵලදායිතාව සඳහා බුද්ධිමය දේපළ අයිතිවාසිකම් භාවිතා කිරීම.

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි යෝජිත කුළුණු පහ :**

1. සේවා නියුක්තිය
2. අධ්‍යාපනය සහ පුහුණුව
3. මහජන කේන්ද්‍රීය ආර්ථිකය
4. සමාජ ආරක්ෂණය සහ හිමිකම්
5. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් දැනටමත් උපදේශන කමිටුවක් සහ අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් නම් කර ඇති අතර මෙම කමිටුව හරහා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීමට අපේක්ෂා කෙරේ. එම ප්‍රතිපත්තිය සඳහා කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු මානව සම්පත් ප්‍රතිපත්තිය ජාතික වශයෙන් සහ උප ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂිතය. මේ වනවිට අප සභාව විසින් අදාළ සියලුම අංශ ආවරණය වන පරිදි සැලසුම් කෙටුම්පතක් සකස් කර ඇත.

## ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියේ සැලැසුම් කෙටුම්පත(Blue Print)

මෙම සැලැස්ම සකස් කිරීමේ දී එය මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත යටතේ දක්වා ඇති විෂය ක්ෂේත්‍ර, තිරසාර සංවර්ධන ඉලක්ක, ජාතික මානව සම්පත් රැකියා ප්‍රතිපත්තියේ ස්තම්භයන් පහ සහ ‘‘සෞභාග්‍යය දැක්ම’’ ජාතික ප්‍රතිපත්ති රාමුව යටතට ගැනෙන ස්තම්භයන් නවය ලෙස සැලකේ.

COVID-19 වසංගතය සහ පැවති සෞඛ්‍ය සීමාවන් හේතුවෙන් විශේෂඥ කණ්ඩායම භෞතිකව එක්රැස් කිරීම බාධාවක් විය.



## 5.2 ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිකයින්ට COVID-19 වසංගතයෙහි ආංශික බලපෑම පිළිබඳ සමීක්ෂණය

2019 දෙසැම්බර් මාසයේ චීනයේ ආරම්භ වූ COVID-19 වසංගතයේ හදිසි ව්‍යාප්තිය ජනතාවගේ සියලුම ආර්ථික හා දෛනික ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි ලෙස බලපාන ලදි. එය තවමත් දකුණු සහ උතුරු ඇමරිකාව, ආසියාව සහ යුරෝපයේ සක්‍රීයව පවතී. රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අවශ්‍ය වැළැක්වීමේ ක්‍රියා මාර්ග කඩිනමින් ගැනීම රටවල් විසින් සිදුකරමින් සිටිති. COVID-19 ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය මේ වන විට සාර්ථක වී ඇතත්, එයින් සිදු වූ හානිය අපමණ ය. රටේ ශ්‍රම වෙළඳපල ගැටළු කෙරෙහි COVID-19 හි බලපෑම හඳුනාගැනීමේ අරමුණින්, ආර්ථික වශයෙන් වඩාත් සංවේදී අංශ සම්බන්ධයෙන් මාර්ගගත සමීක්ෂණයක් පවත්වන ලදී.

ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් දත්ත එක්රැස් කරන ලද අතර සෑම අංශයකින්ම ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා කුඩා සමීක්ෂණ අටක් පවත්වන ලදි. නියැදිය තේරීම සඳහා පහසු සම්භාවිතාමය නොවන නියැදි ක්‍රමය භාවිතා කරන ලදි. ඊමේල් හා අනෙකුත් මාර්ගගත ක්‍රම ඔස්සේ සේව්‍යයන්, ප්‍රවීනයන් සහ අදාළ සංවිධාන අතර විශේෂිත විද්‍යුත් ආංශික ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදි. තෝරාගත් අංශයන්හි ප්‍රවීණයන්ගෙන් සහ සේවායෝජකයින් 206ක නියැදියකින් මේ සඳහා තොරතුරු එක්රැස් කරන ලදි. අධ්‍යයන කාල සීමාව තුළ රටෙහි පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් සීමිත නියැදියක් තෝරා ගන්නා ලදි.

**දළ දේශීය නිෂ්පාදිතය හා සේවා නියුක්තියට ආංශික දායකත්වය**

| අංශය | දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය | සෘජු/ වක්‍ර සේවා නියුක්තිය | බලපෑම (විශේෂඥ අදහස් සහ සමීක්ෂණය මත පදනම්ව උපකල්පනය කර ඇත) |
|---|---|---|---|
| **ඉදිකිරීම්** | 8 | 684,970 | සමාගම් වලින් 60% ක් |
| **සංචාරක** | 4.3 | 600,000 | සේවකයින්ගෙන් 41% - 60%ක් |
| **ප්‍රවර්ධන** | 2.5 | 40,000 – 50,000 | සමාගම් වලින් 85% ක් |
| **විදේශ රැකියා** | 8 | 1,500,000 | සේවකයින් 30,000 -100,000ක් |
| **රෙදිපිළි සහ ඇඟලුම්** | 7.5 | 1,200,000 | සේවකයින්ගෙන් 35%ක් |
| **කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායක** | 52 | 3,000,000 | කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගෙන් 85%ක් |

රූප සටහන 1: දළ දේශීය නිෂ්පාදිතය හා සේවා නියුක්තියට ආංශික දායකත්වය

මූලාශ්‍රය: කාර්තුමය ශ්‍රම බලකායේ සමීක්ෂණ වාර්තාව සහ මහ බැංකු වාර්ෂික වාර්තාව(2019) සහ ජාතික මානව සම්පත් සංවර්ධන සභාවේ සමීක්ෂණය (2020).

මිලියන 6කට අධික පිරිසක් මෙම අංශයන්හි සේවයේ නියුක්ත වන අතර එය සමස්ත රැකියා නියුක්ති ජනගහනයෙන් 75%කට වඩා ඉහළ අගයක් ගනී. තෝරාගත් අංශයන්ගේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය සැලකිය යුතු ලෙස ඉහළ ය.

සමීක්ෂණයන්හි ප්‍රතිඵල වලින් හඳිසි වසංගත තත්ත්වය හේතුවෙන් සියලුම අංශයන්හට බලපෑම් සිදු වී ඇති බව හෙළි විය. සමීක්ෂණයෙහි සොයා ගැනීම් පිළිබඳ අවධානය යොමු කළ ප්‍රවණයින් සහ සංචාරක සහ ආගන්තුක සත්කාර හෝටල් ව්‍යාපාරිකයන්ගෙන් බහුතරයක්(71%) ප්‍රකාශ කර ඇත්තේ මෙම තත්ත්වය හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයට සේවකයින් 41% -60% ක ප්‍රමාණයක් අහිමි වන බවයි. එබැවින් ප්‍රවීණයන්ගෙන් 58% ක් සංචාරක කර්මාන්තයේ රැකියා අහිමි වූ සේවකයන් සඳහා නැවත කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධාරණය කරන ලදි.

අධ්‍යයන විශ්ලේෂණය තුළින් කොවිඩ් -19 වසංගත කාල පරිච්ඡේදය තුළ විදේශ රැකියා අංශයේ සේවය කරන ඇස්තමේන්තුගත සංක්‍රමනික සේවකයින් මිලියන 1 සිට 1.5 දක්වා ප්‍රමාණයක් සිටින බව අනාවරණය වී ඇත. මෙම වසංගතය හේතුවෙන් සංක්‍රමණික සේවකයන්ගේ රැකියා 30,420 සිට 100,000 ප්‍රමාණයකට බලපෑම් සිදු වීම හෝ අහිමි වී යාමට හැකියාව පවති. පසුගිය වර්ෂය හා සැසඳීමේ දී විදේශීය සංක්‍රමිණයකින් විසින් නිෂ්පාදනය කරන පෞද්ගලික ප්‍රේෂණ 2020 වර්ෂයේ මුල් භාගයේ දී 30%ත් 40% දක්වා අඩුවී ඇති අතර විදේශ රැකියාවන් සඳහා කොවිඩ් -19 වසංගතයේ බලපෑම වසර දෙකක් හෝ ඊට වැඩි කාලයක් පවතිනු ඇත.

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගෙන් 23%ක් පමණ මාස 6කට අඩු කාලයක් තුළ නැවත යථා තත්ත්වයට පත්වනු ලබන නමුත් බහුතරයකට (77%) මාස 6කට වඩා වැඩි කාලයක් නැවත යථා තත්ත්වයට පත් වීමට ගතවනු ඇත.

ඇඟළුම් කර්මාන්තයෙහි 64%ක නියැදිය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සම්බන්ධ විය නොහැකි සේවකයින් සඳහා කිසිදු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති බව අනාවරණය විය.

ප්‍රවර්ධන අංශයේ අඩු නිපුණතා සහිත 38%ක ප්‍රමාණයක සේවකයින් රැකියා සුරක්ෂිතතාවයේ ඉහළ අවධානමකට පත්ව ඇති අතර ඍණාත්මක බලපෑම අවම කිරීම සඳහා වැටුප් ගෙවීම් 70.5%ක ප්‍රමාණයකින් කප්පාදු කර ඇත.

අනෙකුත් අංශයන් සමඟ සංසන්දනය කිරීමේ දී, තොරතුරු තාක්ෂණ අංශයට සැලකිය යුතු කිසිදු ඍණාත්මක බලපෑමක් වී නොමැත. කෙසේ වුවද, ප්‍රතිචාර දැක්වූ ආයතන 90.5% මුහුණ දෙන ප්‍රධානතම ගැටළුව වී ඇත්තේ ඔවුන්ගේ ඇණවුම් කල් දැමීමට සිදු වීමයි. සියළු භෞතිකව හමුවීම් වෙනුවට මාර්ගගත හමුවීම් භාවිත කරන ලෙසට සියලු තොරතුරු තාක්ෂණික සංවිධානයන්ට අවසර ලබා දී ඇත. ඒ අනුව මාර්ගගත සමීක්ෂණ මත පදනම්ව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් පහත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

**රජය සඳහා නිර්දේශ :**

කොවිඩ් -19 ව්‍යාප්තිය පිළිබඳ සලකා බැලීමේ දී, රජය අහිතකර පීඩාවන්ගෙන් අංශයන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන්ට විවිධ වූ උපකාර සහ සහන ලබා දීම ආරම්භ කර ඇත. අවසානයෙහි සේවකයින්හට ප්‍රතිලාභ හිමිවන අංශ නැවත පුනරාරම්භය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ගත හැකි විවිධ විශේෂිත ක්‍රමෝපායන් පහත දක්වා ඇත.

**සේවා නියුක්තිය :**

- ❖ වසංගත තත්ත්වයන් හා ඉන් ඉදිරිය සඳහා තරඟකාරී වන නව සංචාරක ආදර්ශ (නිදසුන්: සෞඛ්‍ය සංචාරක) හඳුන්වා දීම.
- ❖ රට තුළ ඇඟළුම් සහ අමුද්‍රව්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
- ❖ සේවය කිරීමේ නව ක්‍රම, නිවසේ සිට සේවය කළ හැකි ගෘහ ඇඟලුම් සංකල්පය හඳුන්වාදීම, ක්‍රමානුකූල සහ පහසුවෙන් නිරීක්ෂණය කළ විද්‍යුත් වාණිජ වේදිකාව සංවර්ධනය කිරීම.

**නෛතික සහ නියාමනය :**

- ❖ ජාතික ප්‍රතිචාර සැලසුම (NPR) සඳහා ශ්‍රී ලංකා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සහ ජාතික ප්‍රතිචාර සැලසුමෙහි කෙටි කාලීන හා දිගු කාලීන ක්‍රියාමාර්ග අදාළ පාර්ශවකරුවන් සමඟ ක්‍රියාත්මක කළ හැකි වීම.

**ආයතනික සහ පරිපාලනමය :**

- ❖ රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් ඇතුළුව සමස්ත රජයේ සහ සමස්ත සමාජයේ ප්‍රවේශයන් භාවිතා කරමින් ප්‍රේෂණ වැඩි කිරීමට සහ විදේශ රැකියා ඉපැයීම් විවිධාංගීකරණය කිරීමට හැකි වන සේ දිගු කාලීන සැලැස්මක් සකස් කිරීම සඳහා බහු පාර්ශ්වීය කාර්යය සාධක බලකායක් පිහිටුවීම.
- ❖ ශක්තිමත් කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම.
- ❖ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය ව්‍යාපාර සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් ආධාරක මධ්‍යස්ථාන/ උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

**මූල්‍යමය :**

- ❖ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාවසායකයින් බිහි කිරීම සඳහා ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල් හඳුන්වා දීම.
- ❖ කොන්ත්‍රාත්කරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ පැවැත්මට පහසුකම් සැලසීම සඳහා සුදුසු ඉදිකිරීම් කර්මාන්ත රෙගුලාසි ලිහිල් කිරීම. බැංකු කටයුතු ආදියෙන් සහන ලබා ගැනීම මේ සඳහා ඇතුළත් වේ.
- ❖ සහන පොලී අනුමාත මත ස්වයං රැකියා සඳහා බැංකු ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම සහ විදේශගත ශ්‍රමිකයින් ලබාගෙන ඇති හිඟ ණය වාරික නැවත ගෙවීම සඳහා සහන සැලසීම.

**තාක්ෂණික :**

- ❖ බලපෑමට ලක් වූ සේවකයින්ගේ රැකියා වියුක්ත දත්ත සමුදායක් නැවත සකස් කිරීම සහ ඒ අනුව අවශ්‍ය කර්මාන්ත /කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නැවත යෙදවීම සඳහා නිපුණතා සකස් කිරීම සහ නැවත සංවර්ධනය කිරීම.

- ❖ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදය විසින් මේ වනවිටත් වීඩියෝ සම්මන්ත්‍රණ යෙදුමක් (meet.gov.lk) නිපදවා ඇති නමුත්, බොහෝ පෞද්ගලික සහ පොදු ආයතන ප්‍රධාන වශයෙන් zoom තාක්ෂණය සහ Microsoft Teams වැනි ගෙවීම් සිදුකරන යෙදවුම් භාවිත කරයි. එක්සත් ජනපද ඩොලර් ගලා ඒම අවම කිරීම සඳහා රජයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතන විසින් සකස් කරන ලද නොමිලේ සපයන යෙදුම් භාවිතා කරමින් වීඩියෝ සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීමට ජනතාව උනන්දු කළ හැකි ය.

## 5.3 දේශීය කර්මාන්තයන්හි වත්මන් තත්වය හා ඒ ආශ්‍රිත මානව සම්පත් ගැටළු :

ශ්‍රී ලංකාවේ බොහෝමයක් දේශීය කර්මාන්ත අභාවයට යන කලක, නව රජයේ අවධානය මේ දෙසට යොමු වී තිබේ. ඒ අනුව රාජ්‍ය අමාත්‍යාංශ පිහිටුවීමේදී ශ්‍රී ලංකාවේ දේශීය කර්මාන්ත හා අඩු අවධානයක් යොමු වන අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කර නව රාජ්‍ය අමාත්‍යාංශ පිහිටුවා ඇත.

මෙම කර්මාන්ත හා අංශ වලට ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකියයුතු තරමේ දායකත්වයක් ලබා දීමට ඉහළ හැකියාවක් ඇත. මේ අනුව මෙම කර්මාන්ත හා අංශවල වත්මන් තත්වයන් හඳුනාගැනිම හා එමගින් පවතින මානව සම්පත් ගැටලු හඳුනා ගෙන ඊට පිළියම් යෙදීම මගින් මෙම කර්මාන්ත සහ අංශවල පූර්ණ දායකත්වය ආර්ථිකයට ලබා ගැනීමට හැකියාවක් පවතී.

### 5.3.1 බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්තය

ශ්‍රී ලංකාව, බොහෝ ශිල්ප කර්මාන්ත සඳහා නිවහන ලෙස සැලකේ. ඒ අතුරින් වත්මන් රජයේ ආර්ථික වර්ධන න්‍යායපත්‍රයේ බතික් කර්මාන්තය සඳහා සැලකිය යුතු ස්ථානයක් ලබා ඇත. ශ්‍රී ලංකාවේ බතික් කර්මාන්තය බොහෝ දුරට ගෘහස්ථ හෝ ප්‍රජා පාදක කර්මාන්තයක් වන අතර එය දේශීය සාම්ප්‍රදායික සංස්කෘතිය හා උරුමය කෙරෙහි ගැඹුරින් මුල් බැස ගෙන ඇත. මෙම කර්මාන්තය ආරම්භයේ සිට වර්තමානය තෙක් අද්විතීය ශ්‍රී ලාංකික රෙදිපිළි කලාවක් දක්වා වර්ධනය වී ඇති අතර එය ඒක පුද්ගල නිර්මාණ කුසලතා, නිර්මාණශීලිත්වය සහ තිරසාර බව කෙරෙහි ඒකාබද්ධ ව පවතී. බතික් කර්මාන්තය ආර්ථිකයේ වැදගත් ස්ථානයක අත්කර ගෙන ඇත්තේ කාන්තාවන් සහ ශිල්පීන් සවිබල ගැන්වීම, කුටුම්භ ආදායම උත්පාදනය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාව අතර දරිද්‍රතාවය තුරන් කිරීම කෙරෙහි ඇති හැකියාව නිසාවෙනි.

අත්යන්ත්‍ර කර්මාන්තය ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ යටතේ ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් සැලකිය යුතු පිරිසකට ජීවනෝපාය සහ රැකියා උත්පාදනය සඳහා සංවර්ධනය කළ හැකි කර්මාන්තයක් ලෙස හඳුනාගෙන තිබේ. මෙම කර්මාන්තය තුළ රජයේ නිෂ්පාදන මධ්‍යස්ථාන පළාත් සභාවල විෂය පථයට අයත් වන අතර රෙදිපිළි කර්මාන්ත දෙපාර්තමේන්තුව හරහා ප්‍රතිපත්ති සම්පාදනය, පුහුණුව, සැලසුම් සංවර්ධනය සහ වෙළඳපල ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යම රජය සම්බන්ධ වේ.

ශ්‍රී ලංකාවේ අත්යන්ත්‍ර කර්මාන්තය අධික ශ්‍රමය හා අපනයනය පදනම් කරගත් ග්‍රාමීය කර්මාන්තයක් ලෙස හැඳින්වේ. මෙම අංශය වසර ගණනාවක් තිස්සේ පහත වැටී ඇතත්, එයින් සැලකිය යුතු රැකියා ප්‍රමාණයන් උත්පාදනය කිරීමේ විභවයක් සහ අපනයන ඉපැයීමේ අවස්ථා ඇති කර්මාන්තයකි. මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ගෘහ කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක වන අතර බොහෝ පේෂකර්මාන්තකරුවන් ඔවුන්ගේ ජීවිකාව ලෙස මෙම කර්මාන්තයේ යෙදෙන අතර අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයේ හෝ ගෘහ සේවයේ නිරත වේ.

මේ වන විට ජාතික ශිල්ප සභාව (එන්.සී.සී.) යටතේ බතික් ශිල්පීන් 2041 ක් ලියාපදිංචි වී ඇත. ඔවුන් අතර බහුතරයක් මහනුවර දිස්ත්‍රික්කයෙන් සොයාගත හැකිය. බතික් ශිල්පීන් පිළිබඳ ඉහත සංඛ්‍යා ලේඛන තිබුණද, මෙම කර්මාන්තයට සම්බන්ධ සේවකයින් සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත දත්ත නොමැත.

ජාතික ශිල්ප සභාව යටතේ රෙදිපිළි ශිල්පීන් 3171 ක් ලියාපදිංචි වී ඇත. EDB (2020) හි කර්මාන්ත ශක්‍යතා වාර්තාවට අනුව, මෙම කර්මාන්තය 15,000 ක පමණ පිරිසකට රැකියා අවස්ථා ලබා දෙයි. නමුත් මෙම කර්මාන්තය තුළ රෙදිපිළි කර්මාන්තයේ නියුතු මුළු සේවකයින් සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත දත්ත නොමැත.

බතික් සහ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සලකා බැලීමේදී හඳුනා ගන්නා ලද ප්‍රධාන කරුණක් නම්, බතික් සහ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සඳහා වෙනම එච්එස් කේතයක් (HS Code) නොමැති බවයි. එබැවින්, රෙදිපිළි හා රෙදිපිළි භාණ්ඩ කාණ්ඩයට බතික් සහ අත්යන්ත්‍ර නිෂ්පාදන අපනයනය කරනු ලැබේ. ඒ අනුව, රෙදිපිළි හා රෙදිපිළි අපනයනවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 372.38 ක් වන අතර එය 2019 දී සිදු වූ මුළු අපනයනයෙන් 2.35% කි. මෙයින් පෙන්නුම් කරන්නේ මෙම කර්මාන්ත දෙක ලෝක වෙළඳපොළ තුළ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බවයි.

බතික් හා අත්යන්ත්‍ර කර්මාන්තයට අදාළ පුහුණු වැඩසටහන් සපයන රාජ්‍ය ආයතන කිහිපයක් තිබේ. ඒවායින් සමහරක්.

- ජාතික ශිල්ප සභාව
- ජාතික සැලසුම් මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය (SLITA)
- රෙදිපිළි කර්මාන්ත දෙපාර්තමේන්තුව

කර්මාන්තයේ නිපුණතා සංවර්ධන පැත්ත සලකා බැලීමේදී අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට ඇත්තේ ස්ථාන කිහිපයක් පමණක් බව පෙනේ. මෙම වැඩසටහන් බොහොමයක් NVQ සහතික ලබා නොදෙන අතර නිසි යාන්ත්‍රණයක් මගින් අධීක්ෂණය හෝ නියාමනය නොකෙරේ.

**ප්‍රධාන මානව සම්පත් ගැටළු :-**

- **මෝස්තර පිළිබඳ නව අදහස් නොමැති වීම**

ශ්‍රී ලංකාවේ බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්ත තවමත් දශක ගණනාවකට පෙර ශ්‍රී ලංකාවේ මෙම කර්මාන්ත හඳුන්වා දුන් මෝස්තර භාවිතා කරයි. නව මෝස්තර සමඟ නව්‍ය කුසලතා නොමැතිකම මෙම කර්මාන්තයන්හි වර්ධනයට එරෙහිව ඇති එක් ප්‍රධාන කරුණකි. එපමණක් නොව, මෙම කර්මාන්ත නිෂ්පාදකයින් නවෝත්පාදනයන් කිරීමට පෙළඹෙන්නේ බතික් සහ අත්යන්ත්‍ර නිෂ්පාදනවල ගුණාත්මකභාවය හඳුනා ගැනීමට සහ සහතික කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැති බැවිනි. උදාහරණයක් ලෙස, COVID-19 තත්වයත් සමඟ, බතික් නිෂ්පාදකයින් විසින් ඖෂධීය මුහුණු ආවරණ සාදන ලදී. නමුත්

නිෂ්පාදකයින්ට අනුව, ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය මැනීමට සහ ඒවා සහතික කිරීමට ක්‍රමවේදයක් නොමැත. කර්මාන්තයේ මෙම ආකාරයේ ගැටළු නිෂ්පාදකයින්ගේ නව්‍ය හැකියාවන් අධෛර්යමත් කරයි.

නිපුනත්වයෙන් යුතු මානව සම්පතක් යනු කර්මාන්තයක සාර්ථකත්වය තීරණය කරන එක් ප්‍රධාන අංගයකි. අඩු වැටුප් හා ඉපැයීමේ හැකියාව නිසා තරුණ පරම්පරාව මෙම කර්මාන්ත කෙරෙහි ආකර්ෂණය නොවේ. ඉහත සඳහන් කළ පරිදි තාක්ෂණයට මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවනු ඇති අතර ඉහළ නිපුණතා ශ්‍රමය සඳහා පුහුණුව මේ මොහොතේ දී ඉතා වැදගත් වේ. බොහෝ රජයේ ආයතන විවිධ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබුවද, මෙම වැඩසටහන් කිසිවක් නිසි යාන්ත්‍රණයකින් නියාමනය නොකරන බව පෙනේ. තරුණ ආකර්ෂණය නොමැතිකම සහ මෙම කර්මාන්තවල ඔවුන් රඳවා තබා ගැනීමේ දුෂ්කරතාවයට මෙය එක් හේතුවක් විය හැකිය.

❖ **මූල්‍ය සාක්ෂරතාවය නොමැතිකම**

බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්ත අඩු ආදායම්ලාභී පවුල් බහුතරයක් සේවය කරන ග්‍රාමීය කර්මාන්ත වේ. මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුමක් නොමැතිකම හේතුවෙන් මෙම කුටුම්භයන්ගෙන් බොහොමයක් අඩු ආදායම් උගුලෙන් බේරීමට අරගල කරති. එපමණක් නොව, අතරමැදියන් තමන් වෙනුවෙන් ලාභයක් රඳවා තබා ගන්නා අතර එමඟින් නිෂ්පාදකයින්ට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වන අතර පාරිභෝගිකයින් නිෂ්පාදනය සඳහා අධික මිලක් ගෙවයි.

## 5.3.2 පිත්තල කර්මාන්තය

පිත්තල කර්මාන්තය ශ්‍රී ලංකාවේ පවුල සමඟ සමීපව සම්බන්ධ වී ඇත්තේ අවම වශයෙන් එක් පිත්තල භාණ්ඩයක්වත් නොමැතිව ශ්‍රී ලංකාවේ නිවසක් නිම නොවන බව විශ්වාස කරන බැවිනි. ඊට අමතරව, දිදුලන රන්වන් පිත්තල තෙල් ලාම්පුවක් දැල්වීම වාසනාව ගෙන දෙන බව ශ්‍රී ලාංකිකයින් විශ්වාස කරන අතර එය සෑම විශේෂ උත්සවයක්ම, ජාතික උත්සව හා උත්සවයක්ම ආරම්භ කිරීමට යොදා ගනී. එබැවින් ශ්‍රී ලංකාවේ පිත්තල නිෂ්පාදන කර්මාන්තය රටේ සංස්කෘතියේ කොටසක් බව පැවසිය හැකිය.

ජාතික ශිල්ප සභාව (එන්.සී.සී.) පිත්තල ශිල්පීන් වෙන වෙනම ලියාපදිංචි නොකරන අතර ලෝහ මත පදනම් වූ සියලුම ශිල්පීන් එකම කාණ්ඩයකට සලකා බලයි. ඒ අනුව, ලෝහ ආශ්‍රිත ශිල්පීන් 217 ක් එන්.සී.සී. හි ලියාපදිංචි වී ඇති අතර ඔවුන්ගෙන් බහුතරය මහනුවර දිස්ත්‍රික්කයේ (114) සිටිති. සැලකිය යුතු කාරණය නම්, හම්බන්තොට, මොණරගල, අම්පාර, මුලතිවු සහ කිලිනොච්චි වැනි දිස්ත්‍රික්කවල ලියාපදිංචි ලෝහ ආශ්‍රිත හස්ත කර්මාන්ත ශිල්පීන් නොමැත.




රූපය 1: දිස්ත්‍රික්කය අනුව ලෝහ ආශ්‍රිත හස්ත කර්මාන්ත
මූලාශ්‍රය - ජාතික ශිල්ප සභාව, 2020

ශ්‍රී ලංකාවේ පිත්තල කර්මාන්තය ප්‍රධාන වශයෙන් මධ්‍යම පළාත පුරාවටමත් දිවයිනේ සෙසු ප්‍රදේශවල හුදෙකලා ගම්මානවලත් ව්‍යාප්ත වී ඇත. මෙම කර්මාන්තය මහනුවර හා ඒ අවට විශේෂයෙන් පිළිමතලාව ප්‍රදේශයේ සංකේන්ද්‍රණය වී ඇත. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා 1965 වර්ෂයේදී පැවති රජය මගින් මහනුවරට ආසන්නව "කලාපුරය" නමින් විශේෂ ගම්මානයක් නිර්මාණය කළ අතර පසුව බොහෝ පිත්තල ශිල්පීන් මෙම ගමට සංක්‍රමණය වී ඇත.

පිත්තල කර්මාන්තයට අදාළ පුහුණු වැඩසටහන් සපයන රාජ්‍ය ආයතන ඉතා සීමිතය. ජාතික ශිල්ප සභාව, VTA සහ NAITA වැනි රජයේ ප්‍රමුඛ වෘත්තීය පුහුණු ආයතන මගින් පිත්තල උපකරණ සම්බන්ධ කිසිදු පුහුණු වැඩසටහන් ලබා නොදෙන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. 2018 දී ජාතික සැලසුම් මධ්‍යස්ථානය පිත්තල උපකරණ සම්බන්ධ පුහුණු වැඩසටහන් 2 ක් පවත්වා ඇති අතර මෙම වැඩසටහන් හරහා ශිල්පීන් 47 දෙනෙකු පුහුණු කර ඇත. මෙම සියලු වැඩසටහන් කෙටි කාලීන පුහුණු වැඩසටහන් වන අතර එහි කාලසීමාව දින 1 සිට 3 දක්වා වන අතර මෙම වැඩසටහන් කිසිවකට NVQ මට්ටමේ සහතික ලබා දී නොමැත.

**ප්‍රධාන මානව සම්පත් ගැටළු -**

පිත්තල කර්මාන්තයේ මානව සම්පත් සම්බන්ධ ගැටළු රාශියක් ඇති බැවින් වර්තමාන තත්ත්වය ඉතා අහිතකර බව අනාවරණය වේ. ඒවායින් කිහිපයක් පහත පරිදි පැහැදිලි කළ හැකිය.

- **තරුණ පරම්පරාවේ ආකර්ෂණය කර්මාන්තයට නොමැතිකම**

  ශතවර්ෂ ගණනාවක් තිස්සේ භාවිතයට ගෙන ඇති සාම්ප්‍රදායික පිත්තල නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ හැඳෑරීමට හා ඇතුළු වීමට තරුණ පරම්පරාවට උද්‍යෝගයක් නැත. මෙම හේතුව නිසා මෙම

සාම්ප්‍රදායික කර්මාන්තයේ නියැලෙන ප්‍රජාව ක්‍රමයෙන් අඩුවීම මෙම කර්මාන්තයේ පැවැත්ම පිළිබඳ බරපතල ප්‍රශ්නයක් නිර්මාණය කරයි. නවීන නිෂ්පාදන කර්මාන්තය සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර දේශීය නිෂ්පාදකයින් පවා නවීන තාක්ෂණයන් ඉක්මණින් අනුවර්තනය කර ඇතත්, සාම්ප්‍රදායික පිත්තල කර්මාන්තය තවමත් යල්පැනගිය තාක්ෂණයෙන් නොනැසී පවතින අතර එමඟින් එම කර්මාන්තය අඩු කාර්යක්ෂමතාවයක් සහ අඩු තරඟකාරිත්වයක් ඇති කරයි. තරුණ පරම්පරාව අතර ආකර්ෂණය අඩු වීමට ප්‍රධාන හේතුවද මෙයයි. එබැවින් සාම්ප්‍රදායික පිත්තල නිෂ්පාදන කර්මාන්තයට තාක්ෂණික අවශ්‍යතා තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පර්යේෂණ පැවැත්වීම අවශ්‍ය වන අතර එමඟින් ඵලදායිතාව සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා තාක්ෂණික අවශ්‍යතා හඳුනා ගැනීම අවශ්‍ය වේ.

මෙම කර්මාන්තයේ තවත් එක් වැදගත් ගැටළුවක් වන්නේ අමුද්‍රව්‍ය සොයා ගැනීමේ දුෂ්කරතාවයයි. මෙම ගැටළුවද නව පරම්පරාව කර්මාන්තයට පිවිසීමට ඇති බාධාවක් වී ඇත.

❖ **සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු**

පිත්තල කම්කරුවන්ට ශ්වසන අපහසුතා (හුස්ම ගැනීමේ ගැටළු) වර්ධනය වීමේ සැලකිය යුතු ඉහළ අවධානමක් ඇති අතර ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීමට හෝ මෙම කර්මාන්තයේ ශිල්පීන්ට සෞඛ්‍ය ප්‍රතිලාභ ලබා දීමට ක්‍රමවේදයක් නොමැත. එබැවින් කර්මාන්තය පවත්වා ගෙන යාම සඳහා සෞඛ්‍ය උපද්‍රව අවම කිරීම සඳහා පියවර ගත යුතුව ඇත.

❖ **පිත්තල උපකරණ හා සම්බන්ධ වෘත්තීය පුහුණුව නොමැතිකම**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET) ආයතන පිත්තල කර්මාන්තයට අදාළ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අඩු උනන්දුවක් දක්වන අතර ප්‍රමුඛ වෘත්තීය පුහුණු ආයතන වන VTA සහ NAITA වැනි ආයතන පිත්තල භාණ්ඩ සම්බන්ධ පුහුණු වැඩසටහන් නොපවත්වයි. එපමණක් නොව, ජාතික ශිල්ප සභාව සහ ජාතික මෝස්තර ආයතනය මඟින් දැනට පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ද NVQ සහතික ලබා නොදේ.

### 5.3.3 සමුද්‍ර, මිරිදිය සහ ජලජීවී වගාව, ඉස්සන් ගොවිතැන සහ විසිතුරු මත්ස්‍ය වගාව

ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික තත්ව තුළ ධීවර අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සත්ත්ව ප්‍රෝටීන් මත්ස්‍ය නිශ්පාදන සඳහා වැදගත් ප්‍රභවයක් වන අතර 2018 දී මෙම අංශය උපයන ජාතික අපනයන සඳහා 2.5% ක් පමණ වේ. 2018 වසරේදී මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන අපනයනය මෙ.ටො. 28771 වේ. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම, අගය එකතු කිරීමේ හැකියාව සහ ආනයන ආදේශනය තුළින් මෙම අංශයේ දායකත්ව මට්ටම ඉහළ නැංවීමට සැලකිය යුතු හැකියාවක් ඇත.

ගම්මාන වැව්වල මිරිදිය මත්ස්‍ය වගාව 1979 දී ධීවර අමාත්‍යාංශයේ දේශීය ධීවර අංශය විසින් රටේ වියළි කලාපයේ වැව් 23 කින් ආරම්භ කරන ලද අතර 1979 සිට තිලාපියා සහ කාප් මත්ස්‍ය භාවිතා කර මත්ස්‍ය වගාව සිදු කර ඇත. 1980 දශකයේ මුල් භාගයේ දී කුඩා පරිමාණ ව්‍යවසායකයින් ගණනාවක් සහ බහුජාතික සමාගම් කිහිපයක් රජය විසින් ලබා දුන් දිරිගැන්වීම්වලට ප්‍රතිචාර දක්වමින් තීරුබදු රහිත ආදාන ආනයනය ද ඇතුළුව වෙරළබඩ පොකුණු වල යෝධ කොටි ඉස්සන් (පෙනියස් මොනොඩොන්) වගාව ආරම්භ කළහ. 1990 දශකයේ අග භාගයේදී, ප්ලාස්ටික් කරන ලද කම්බි දැල් කූඩුවල ඉන්දු-පැසිෆික් වගුරු කකුළුවන් (ස්කයිලා සෙරාටා) වාණිජව වර්ධනය වීම වෙරළ කලපු වල ආරම්භ විය.

ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර එය නගරවල කුඩා පරිමාණ ගෘහස්ථ අලෙවිසැල් වලින් ආරම්භ කරන ලදී. 1930 ගණන්වල මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ආනයනකරුවන් සහ අභිජනනය කරන්නන් කිහිප දෙනෙක් සිටියහ. 1952 දී ශ්‍රී ලංකාවේ අගනුවර වන කොළඹදී වාණිජ මින්මැදුරක් ආරම්භ කරන ලදී. මෙම කර්මාන්තය මීට වසර 50 කට පමණ පෙර ව්‍යවසායකයින් කිහිප දෙනෙකු විසින් වාණිජකරණය කරන ලද අතර එය දැන් බොහෝ දෙනෙකුට ලාභ සහ රැකියා ලබා දෙන දියුණු කර්මාන්තයක් බවට වර්ධනය වී තිබේ. විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රධාන වශයෙන් සිමෙන්ති ටැංකි තුළ සිදු කෙරේ.

2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ධීවර කුටුම්භ 181,880 ක් සමුද්‍රීය ධීවර අංශයෙන් සොයා ගත හැකි ය. 2018 වසරට සාපේක්ෂව 2019 වර්ෂයේදී සමුද්‍ර ධීවර කුටුම්භ 1770 ක් අඩු වී ඇත. එසේම, සමුද්‍ර ධීවර කුටුම්භයන්ගෙන් බහුතරයක් ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවල සොයා ගත හැකි අතර ධීවර කුටුම්භ සුළු වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් සොයා ගත හැකිය.

දේශීය හා ජලජීවී වගා අංශයෙන් ධීවර කුටුම්භ 56,250 ක් සොයා ගත හැක. 2017 වර්ෂයේ ධීවර කුටුම්භ සංඛ්‍යාවට සාපේක්ෂව 2018 වර්ෂයේදී දේශීය හා ජලජීවී වගා අංශයේ ධීවර කුටුම්භ 2080 වන විට වැඩි වී ඇත. තවද, වැඩිම දේශීය හා ජලජීවී ධීවරයින් සංඛ්‍යාවක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාප්තිගත වී ඇති අතර දෙවන හා තෙවන වැඩිම මිරිදිය සහ ජලජීවී වගා මසුන් ඇල්ලීම පිළිවෙලින් පොළොන්නරුව සහ

පුත්තලම දිස්ත්‍රික්කවල දැක ගත හැකිය. අඩු දේශීය හා ජලජීවී වගා මසුන් ඇල්ලීම පිළිවෙලින් යාපනය සහ කෑගල්ල දිස්ත්‍රික්කවල දැක ගත හැකිය.

සමුද්‍ර හා දේශීය හා ජලජීවී වගා අංශයේ සෘජු හා වක්‍ර රැකියා 583,000 ක් 2018 වර්ෂයේදී නිර්මානය කර ඇති අතර එය 2019 වසරට සාපේක්ෂව 2018 වර්ෂයේදී 1000 කින් වැඩි වී ඇත.

ලියාපදිංචි ඉස්සන් ගොවිපළවල් සංඛ්‍යාව 827 ක් වන අතර ලියාපදිංචි අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව 49 කි. දැනට ලියාපදිංචි ඉස්සන් ගොවිපළවල් සහ අභිජනන මධ්‍යස්ථානවල සේවය කරන සේවකයින් සංඛ්‍යාව 4380 ක් පමණ වේ. එසේම, ලියාපදිංචි විසිතුරු මත්ස්‍ය ගොවිපළවල් සංඛ්‍යාව 939 ක්ද දැනට ලංකාවේ ක්‍රියාත්මක වන ලියාපදිංචි අභිජනන මධ්‍යස්ථාන ගණන 4 ක්ද වේ. දැනට ලියාපදිංචි විසිතුරු මත්ස්‍ය ගොවිපළවල් සහ අභිජනන මධ්‍යස්ථානවල සේවය කරන සේවකයින් සංඛ්‍යාව 4900 ක් පමණ වේ.

සමුද්‍ර අංශයේ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය 2019 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 415,490 ක් පමණ වන අතර 2018 වර්ෂයේ සමුද්‍ර අංශයේ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය හා සසඳන විට 2019 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 23,880 කින් අඩු වී තිබේ. එසේම, 2018 වර්ෂයේ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය, දේශීය හා ජලජීවී වගා අංශය තුළ මෙට්‍රික් ටොන් 87,690 ක් පමණ වන අතර එය 2017 වර්ෂයේ දී මිරිදිය සහ ජලජීවී වගාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය හා සසඳන විට මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,820 කින් වැඩි වී ඇති බව පෙනේ. 2019 දී ඉස්සන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6,400 ක් පමණ වූ අතර එය 2018 වර්ෂයේ දී ඉස්සන් නිෂ්පාදනය හා සසඳන විට ඉස්සන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 18,750 කින් අඩු වී ඇති බව දැකිය හැකිය.

සමුද්‍රීය සහ මිරිදිය මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන යන දෙඅංශයේම අපනයන ප්‍රමාණය 2019 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 28,771 ක් පමණ වන අතර එය 2018 වර්ෂයේදී සමුද්‍ර හා දේශීය මත්ස්‍ය හා ධීවර නිෂ්පාදනවල අපනයන ප්‍රමාණය හා සසඳන විට මෙට්‍රික් ටොන් 773 කින් වැඩි වී ඇත. 2019 දී ඉස්සන්ගේ අපනයන වටිනාකම රු. මිලියන 3522 ක් වන අතර එය රු. 2018 දී ඉස්සන්ගේ අපනයන වටිනාකම හා සසඳන විට රුපියල් මිලියන 37 කින් වැඩි වී ඇත. එසේම, 2019 වර්ෂයේ විසිතුරු මසුන්ගේ අපනයන වටිනාකම රු. මිලියන 2913 ක් වන අතර එය 2018 වර්ෂයේ දී විසිතුරු මසුන්ගේ අපනයන වටිනාකම හා සසඳන විට රු.මිලියන 287 ක වැඩි වීමකි.

**දේශීය හා ජලජීවී වගාව සඳහා පුහුණුව**

NAQDA විසින් සඳහන් කර ඇති පරිදි දේශීය හා ජලජීවී වගා අංශය සඳහා පුහුණු මධ්‍යස්ථාන හතරක් දැනට පවත්වාගෙන යනු ලැබේ. දේශීය හා ජලජීවී වගා ගොවීන් පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති පුහුණු මධ්‍යස්ථාන සැලකීමේ දී, කලාවැව පුහුණු මධ්‍යස්ථානය තුල පුහුණු ධාරිතාව 330 ක් (නවාතැන් පහසුකම් 100 ක්) වන අතරඋඩවලව, දඹුල්ල, ඉඹිනියාගල යන සෑම මධ්‍යස්ථානයකින්ම පුහුණු ධාරිතාව 25 ක් පමණ වේ.

**ධීවර අංශය විසින් හඳුනාගෙන ඇති මානව සම්පත් සංවර්ධන හා වෙනත් ගැටළු :**

**දේශීය හා ජලජීවී වගාව සම්බන්ධ ගැටළු :**

1. මිරිදිය ධීවරයින්ගෙන් ඉතුරුම් අඩු වීම
2. වියදම් පාලනය කිරීම පිළිබඳ දැනුමක් නොමැතිකම

**ඉස්සන් වගාව ආශ්‍රිත ගැටළු:**

1. සුදු ළප රෝග නිසා වගාකරුවන් විසින් ඉස්සන් ගොවිපළ අත්හැරීම

2. ඉස්සන් සඳහා අඩු මිලකට ආහාර ලබා ගැනීමේ දුෂ්කරතාව

3. රෝගී ඉස්සන් කළපුවලට මුදා හරිනු ලබන්නේ නිසි ආකාරයෙන් නොවේ. මෙවැනි ඉස්සන් බොහෝවිට ගොවිපළවල් හරහා බැහැර කරන අපවිත්‍ර ජලය හරහා කලපු වලට නුසුදුසු ලෙස කලපුවලට යොමුකරවීම හේතුවෙන් ස්වාභාවික කළපු පරිසර පද්ධතිවල සුපෝෂනය වැඩිවී කළපුවේ ධීවරයින්ගේ ආදායම් ප්‍රභවයන් අඩු වීමට මග පාදයි.

**විසිතුරු මත්ස්‍ය වගාව හා සම්බන්ධ ගැටළු :**

1. NAQDA ව්‍යාප්ති නිලධාරීන් විසින් දෙන ලද තාක්ෂණික උපදෙස් නිසි ලෙස අනුගමනය නොකර විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැළෙන වගාකරුවන් නිසා ගුණාත්මක විසිතුරු මත්ස්‍ය ප්‍රභේද නොලැබීම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයන අවස්ථා අහිමි වීම. ඒ හේතුවෙන් ඔවුන්ට එම විසිතුරු මාළු වර්ග දේශීය වෙළඳපොලේ අඩු මිලකට අලෙවි කිරීමට සිදුවීම.

2. විසිතුරු මත්ස්‍ය විශේෂ නිෂ්පාදනය සඳහා ආහාර හා ඖෂධ ලබා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම නිසා විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පවත්වාගෙන යාමේ ගැටළු ඇතිවීම.

3. නිසි පුහුණුවක් හා දැනුමක් නොමැතිව විසිතුරු මත්ස්‍ය වගාවට පිවිසෙන වගාකරුවන් ඉතා කෙටි කාලයක් තුළ කර්මාන්තයෙන් ඉවත් වී යාම.

4. විසිතුරු මත්ස්‍ය විශේෂ මිලදී ගන්නා දේශීය ගැනුම්කරුවන් එම විශේෂ සාධාරණ මිලකට මිලදී නොගන්නා අතර එම විශේෂ විකිණීම සඳහා අඛණ්ඩ වෙළඳපොලක් නොමැති වීම.

### 5.3.4 වී වගාව

කුඹුර හෝ කෙත යනු ගොවීන් විසින් වී වගා කරන භූමියයි. සහල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වන අතර ශ්‍රී ලංකාවේ වී වගාව කෘෂිකාර්මික කර්මාන්තය තුළ අතිශයින් වැදගත් වේ. පුරාණ හා සාම්ප්‍රදායික ගොවීන් සහල් නිෂ්පාදනයේ දී ස්වයංපෝෂිත වූ අතර පුරාණ ශ්‍රී ලංකාව වී අපනයනය කරන ප්‍රමුඛයින් අතර සිටියහ. ශ්‍රී ලංකා රජවරුන්ගේ පාලන සමයේ දී මහා පරිමාණ වාරිමාර්ග ටැංකි ඉදිකිරීම් තුලින් කෘෂිකර්මාන්තයට විශාල දායකත්වයක් දැක්විය. මහා පරාක්‍රමබාහු රජ සමයෙහි සහල් අපනයනය කල බවට ද ඉතිහාසයේ සඳහන් වේ.

මෙවන් කීර්තිමත් ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා වර්තමානයේදීද විශේෂ ස්ථානයක් හිමිවේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ මුළු වගා භූමි ප්‍රමාණයෙන් වී වගාව 34% පමණ වන අතර එය හෙක්ටයාර 884,555 පමණ වේ. ගොවි පවුල් මිලියන 1.8 ක් පමණ රට පුරා වී වගාවේ නිරතවී සිටිති. මහ කන්නය වන සැප්තැම්බර් සිට මාර්තු දක්වා කාලයේ ඉඩම් හෙක්ටයාර 557,221 සහ යල කන්නය වන මැයි සිට අගෝස්තු දක්වා කෙටි කාලයේ හෙක්ටයාර 327,334 ඉඩම් ප්‍රමාණයක් වගා කර තිබේ.

ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යා දත්ත වලට අනුව 2018 වර්ෂයේ දී වී මෙට්‍රික් ටොන් 0.03 ක ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා රුපියල් මිලියන 0.019 වැය කර ඇති අතර හාල් මෙට්‍රික් ටොන් 248901ක් ආනයනය කිරීම සඳහා රුපියල් මිලියන 16679 වැය කර තිබේ. මෙම වර්ෂයේ දී වී මෙට්‍රික් ටොන් 66 ක ප්‍රමාණයක් අපනයනය කිරීමෙන් රුපියල් මිලියන 11.93 ආදායමක් සහ සහල් මෙට්‍රික් ටොන් 5378 අපනයනය කිරීමෙන් රුපියල් මිලියන 870 ක ආදායමක් උපයා ඇත. 2017 හා 2018 වර්ෂවලදී සහල් සහ වී අපනයනය කිරීමෙන් උපයා ගත් ආදායම පිළිවෙළින් රුපියල් මිලියන 785.87ක් හා 881.93කි. මේ අනුව අපනයන ආදායම 2017 වර්ෂයට වඩා රුපියල් මිලියන 96.06 ක් 2018 වර්ෂයේ දී උපයා ගෙන ඇත.

**මානව සම්පත් ගැටළු :**

මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටළුව වන්නේ තරුණ ප්‍රජාව මෙයට යොමුවීමට මැළිකමක් දැක්වීමයි. නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය විසින් කරන ලද අධ්‍යයනයකට අනුව, අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගෙන් බහුතරය වයස 46-55 අතර වූවන් විය. වී ගොවිතැනේ ඇති අවිනිශ්චිතතාව නිසා තරුණයන් කාර්මික ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමුවන අතර වී ගොවිතැන කෙරෙහි උනන්දුවක් නොදක්වන බව හඳුනා ගෙන ඇත.

### 5.3.5 බඩඉරිඟු වගාව

ගොරෝසු ධාන්‍ය වර්ගයක් ලෙස වර්ගීකරණය කරන ලද බඩඉරිඟු ශ්‍රී ලාංකික ආර්ථිකයේ සාපේක්ෂව සුළු බෝග භූමිකාවක් ඉටු කරයි. බඩඉරිඟු රටේ ජනතාවගේ පරිභරණයට ගනු ලබන්නේ 15% තරම් කුඩා ප්‍රතිශතයකි. එයින් කොටසක් දේශීය වෙළඳපොළ ඉලක්කකර අළෙවි කරන ලබනු අතර ඉතිරිය ගර්භනී මව්වරුන්ට සහ ළදරුවන්ට ත්‍රිපෝෂ නිපදවීමට යොදාගනී. ඉතිරි 85%ක නිශ්පාදනය කුකුළු කෑම සඳහා යොදා ගනී.

ඉතා පහසුවෙන් වගා කල හැකි භෝගයක් ලෙස ප්‍රචලිත බඩඉරිඟු වගාව ශ්‍රී ලංකාවේ වියලි සහ අතරමැදි කලාපීය ප්‍රදේශවල උස් බිම්වල වැඩිපුරම වගාකරනු ලබයි. තවද, කෘමී සහ රෝග හානි ද අනෙකුත් වගාවන්ට සාපේක්ෂව බඩඉරිඟු වගාවේ අඩුය. ලෝකය මුහුණ දී ඇති ඉන්ධන අර්බුදය හමුවේ දියුණු රටවල් විසින් ජෛව ඉන්ධන නිපදවීම සඳහා බඩඉරිඟු වලින් සැලකියයුතු කොටසක් භාවිතා කිරීමට පටන් ගන්නා ලද අතර ඒ සමග ලෝක වෙලඳපොළේ බඩඉරිඟු මිල සීඝ්‍රයෙන් ඉහළ යාමට පටන් ගත් අතර එමනිසා ලංකාවේ නිශ්පාදිත කෘෂි ද්‍රව්‍ය අතුරින් ලෝක වෙළඳපොළේ මිලට වඩා අඩු නිශ්පාදන වියදමක් සහිත භෝගයක් බවට බඩඉරිඟු පත්විය.

වී වලට පසුව ලාංකික ගොවියා වැඩි නැඹුරුවක් දක්වන්නේ බඩඉරිඟු වගාකිරීමටයි. මේ වන විටත් නව පාලනය යටතේ බඩඉරිඟු වගාව සඳහා විශේෂ අවධානයක් යොමු වී ඇත. ඒ අනුව, මේ වන විට බඩඉරිඟු වගා කිරීමේ ජාතික වැඩ සටහනක් ආරම්භ කර ඇත. මහවැලි කළාපයේ අක්කර 3000ක වපසරියක බඩඉරිඟු සංකේතාත්මකව වගා කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර ඇත.

මෙරට නිශ්පාදනය කරනු ලබන බඩඉරිඟු ප්‍රධාන වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නේ සත්ව ආහාර වලට ඇතුලත් කරන ශක්ති සංඝටකයක් ලෙසය. කුකුල් කෑම නිශ්පාදනය සඳහා වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් ලක්ෂ 5ක් වන අතර එම අවශ්‍යතාවයෙන් මෙරට තුල නිපදවනු ලබන්නේ මෙට්‍රික් ටොන් 250,000කි. ඉතිරි මෙට්‍රික් ටොන් 250,000 සඳහා අවශ්‍ය බඩඉරිඟු ප්‍රමාණය ආනයනය කරන අතර ඒ සඳහා වසරකට රුපියල් කෝටි 300ක මුදලක් වැය කිරීමට රජයට සිදුවේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්තවලට අනුව, ලංකාවේ යළ කන්නයේදී බඩඉරිඟු වගාවේ නිරතවන ගොවීන් 21126 ක් පමණ සිටින අතර මහ කන්නයේ 558054ක් වන ගොවීන් සංඛ්‍යාවක් මෙම භෝග වගාවේ නිරත වේ. යළ කන්නයට වඩා මහ කන්නයේ වැඩි ගොවින් ප්‍රමාණයක් බඩ ඉරිඟු නිශ්පාදනයේ නියැළේ. මහ කන්නයේ බඩඉරිඟු වගාකරුවන් වැඩි ප්‍රමාණයක් වාර්තා වන්නේ මොණරාගල දිස්ත්‍රික්කයේය. එය සංඛ්‍යාත්මක ලෙස 219,947 කි. යළ කන්නයේ බඩඉරිඟු වගාකරුවන් වැඩි ප්‍රමානයක් වාර්තා වන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ ය. එය සංඛ්‍යාත්මක ලෙස 21,126 කි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ලබන කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන වාර්තාවට අනුව, බඩඉරිඟු වගාව සඳහා 2018 වසරේදී, හෙක්ටයාර 70,895ක භූමි වපසරියක වගා කර ඇති අතර එම

වසරේම නිශ්පාදනය ටොන් 270,041ක් පමණ වේ. මීට අමතරව බඩඉරිහු ආනයනය පිළිබඳව සැලකීමේදී, 2017 වසරේදී බඩඉරිහු (ඇට) වශයෙන් ටොන් 1,432ක් ආනයනය කර ඇති අතර බඩඉරිහු (වෙනත්) වශයෙන් ටොන් 1,79,589ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. 2018 වසරේදී, බඩඉරිහු (ඇට) වශයෙන් ආනයනය කිරීමේ සුලු වැඩි වීමක් දක්නට ලැබෙන අතර එය ටොන් 1,482ක් වේ. බඩඉරිහු (වෙනත්) වශයෙන් ටොන් 119,086ක් ආනයනය කර ඇති අතර එහි පසු බෑමක් දක්නට ලැබේ.

එම වාර්ථාවට අනුව බඩඉරිහු (ඇට ) අපනයන සංඛ්‍යාව 2017 වසරේදී, ටොන් 0.002ක් වන අතර 2018 වසරේදී මෙම අගයේ සීඝ්‍ර වැඩි වීමක් දක්නට ලැබේ. එය ටොන් 265කි. බඩඉරිහු (වෙනත්) කාණ්ඩයේ අපනයන අගය 2017 වසරේදී ටොන් 2ක් වන අතර එය 2018 වසරේදී ටොන් 1ක අගයක් පෙන්නුම් කරයි.

**බඩඉරිහු කර්මාන්තය හා බැඳී ඇති ප්‍රධාන මානව සම්පත් ගැටළු :**

**කම්කරු හිඟය :**

බඩ ඉරිහු වගාවේ සමහර ප්‍රදේශවල ශ්‍රම හිඟයක් පවතින නමුත් වඩාත්ම වැදගත් කරුණ නම් මෙම වගාවේ ශ්‍රම පිරිවැය ඉහළ මට්ටමක පැවතීමයි. විශේෂ විද්වතුන් පැහැදිළි කළ පරිදි බඩ ඉරිහු වගාවට අනෙකුත් භෝග වලට වඩා වගා කිරීමේදී අඩු ශ්‍රම මැදිහත්වීමක් අවශ්‍ය වේ. එබැවින් මෙම වගාවේ නියැළී සිටින කම්කරුවන්ගේ ශ්‍රමය විභජනය කිරීම වැනි වගාව හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත නොවේ. එපමණක් නොව, අස්වැන්න නෙළන කාලය තුළ යන්ත්‍ර සඳහා වන පිරිවැය වගාකරුවන්ට දැරිය නොහැකි බැවින් ශ්‍රම ශක්තියෙන් යන්ත්‍රෝපකරණ වෙත මාරුවීමට මෙම අංශයට නොහැකි වී ඇත.

❖ **මූල්‍ය සාක්ෂරතාවය නොමැතිකම :**

බඩ ඉරිහු වගාව ප්‍රධාන වශයෙන් ග්‍රාමීය කර්මාන්තයක් වන අතර ගොවීන්ගෙන් බහුතරය අඩු ආදායම්ලාභී පවුල්වල අය වෙති. මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුමක් නොමැතිකම හේතුවෙන් මෙම කුටුම්භයන්ගෙන් බොහොමයක් අඩු ආදායම් උගුලෙන් බේරීමට අරගල කරති. එපමණක්ද නොව, බඩ ඉරිහු කිලෝග්‍රෑමයක මිල රුපියල් 90 කි. අතරමැදියන් තමන්ටම සැළකිය යුතු ලාභයක් රඳවා තබා ගන්නා අතර එමඟින් නිෂ්පාදකයින්ට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වන අතර පාරිභෝගිකයින්, නිෂ්පාදනය මිලදී ගැනීම සඳහා වැඩි මිලක් ගෙවනු ලැබේ.

❖ **කුකුළු ගොවීන් සඳහා වැඩි පිරිවැයක් :**

බඩ ඉරිහු සඳහා ඉහළ වෙළඳපල මිලක් පැවතීම හේතුවෙන්, වඩාත්ම අවාසි සහගත කණ්ඩායම වන්නේ කුකුළු ගොවීන් වන අතර, සමස්ත නිෂ්පාදනයෙන් 85% ක් කුකුළු ගොවිතැන සඳහා ගනු ලැබේ. වර්තමානයේ කුකුළු මස්, බිත්තර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බැවින් බඩ ඉරිහු නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් කුකුළු ආහාර ලෙස භාවිතා කරයි. මූලික ආහාර සොයාගැනීම අපහසු වූවිට කුකුළු ගොවීන් අතරමං වන බැවින් මෙම අංශයට වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

### 5.3.6 කිතුල් වගාව

කිතුල් වගාව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ගෘහ කර්මාන්තයකි. අව්‍යාජ කිතුල් නිෂ්පාදනවල දියවැඩියා නාශක ගුණයක් ඇති බැවින් ඒවා දේශීය වෛද්‍ය ප්‍රතිකාර සඳහා භාවිතා කරන බව දන්නා කරුණකි. මේ පිළිබඳව නිලධාරීන්ගේ අවධානය යොමු නොවීම හේතුවෙන් කිතුල් වගාවට මේ වන විට පැහැදිලි අනාගතයක් දකින්නට නැත. 70 දශකයේ මැද භාගයේ දී එවකට වැවිලි කර්මාන්ත අමාත්‍ය ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතා විසින් කිතුල් කර්මාන්තය පුනරුත්ථාපනය කර ප්‍රතිසංස්කරණය කිරීමට උත්සාහ දරා ඇතත් ඒ කිසිවකින් සැලකිය යුතු බලපෑමක් ඇති නොවූ බව පැහැදිලිය (අබේසිංහ, 1991.)

කිතුල් බහුවිධ ප්‍රයෝජනයන් සහිත ඉතා වටිනා ශාකයක් වන අතර පුෂ්පය ඒහි වඩාත්ම ප්‍රයෝජනවත් කොටස වේ. බොහෝ කිතුල් ශාක රා මැදීම සඳහා යොදා නොගන්නේ එහි වාණිජ වටිනාකම පිළිබඳව ප්‍රජාවගේ නොදැනුවත් බව නිසා විය හැකි ය. කිතුල් ශාකය මඟින් බොහෝ නිෂ්පාදන ලබා දෙන අතර වඩාත් වැදගත් වන්නේ රා, අරක්කු, පැණි සහ හකුරු වැනි නිෂ්පාදන බොහොමයක් බවට පත් කරනු ලබන කිතුල් යුෂ ය: ආරිය අබේසිංහ (1991) ඔහුගේ එක් පර්යේෂණ පත්‍රිකාවක "ශ්‍රී ලංකාවේ කිතුල් කර්මාන්තයේ දියුණුව සඳහා කෘෂි කාර්මික සැලැස්මක්" යනුවෙන් දක්වා ඇති අතර, 90 දශකයේ ශ්‍රී ලංකාවේ කිතුල් කපන්නන්ගෙන් 7% කගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කිතුල් මල් කැපීම මඟින් ලබා ගන්නා කිතුල් යුෂ වලින් පැණි සහ හකුරු සෑදීමයි.

කිතුල් යනු ශ්‍රී ලංකාව පුරා ස්වභාවිකව පවතින ශාකයකි. "ශ්‍රී ලංකාවේ කිතුල් (Caryota urens) යුෂ නිෂ්පාදන මිශ්‍ර කිරීමෙන් ප්‍රමිතිය අඩු කිරීමේ පිළිවෙත පිළිබඳ අධ්‍යයනයක්" නම් වූ පර්යේෂණ ලිපියට අනුව ශ්‍රී ලංකාවේ කිතුල් කර්මාන්තය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක 12 ක් තිබේ (Seneviratne et al 2005). නමුත් 2014 වසරේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කරන ලද "කිතුල් කර්මාන්තය ඌන උපයෝගිතා" පිළිබඳ ලිපියකට අනුව දිස්ත්‍රික්ක 18 ක කිතුල් මල් කැපීම සිදු කරනු ලබයි. ඒ අතරින් රත්නපුර, මහනුවර, මාතර, බදුල්ල, මොණරාගල, ගාල්ල, කෑගල්ල, නුවරඑළිය, කුළුතර, මාතලේ සහ හම්බන්තොට යන ප්‍රධාන දිස්ත්‍රික්ක 11ක් ඇති අතර එහිදී කිතුල් මල් සහ මල් වගාව ප්‍රධාන වශයෙන් අනුබද්ධ කර්මාන්ත ලෙස සිදු කෙරේ.

රත්නපුර, මහනුවර, බදුල්ල, මොණරාගල, මාතර, කෑගල්ල, නුවරඑළිය, කළුතර, ගාල්ල, කුරුණෑගල, මාතලේ, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව සහ පුත්තලම ඇතුළු දිස්ත්‍රික්ක 18ක කිතුල් පැල මිලියන 3ක් පමණ බෙදා හැර ඇති බව 2014 වසරේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් වැවිලි අමාත්‍යාංශය විසින් කරන ලද සමීක්ෂණයකින් හෙළි වී තිබේ. එම ගස්වලින් මේරූ ගස් ලක්ෂ 6ක් පමණ තිබෙන අතර, ඉන් ගස් 120,000ක පමණ රා මැදීම දැනට සිදු කරනු ලබයි. තවද, දිස්ත්‍රික්ක 18 තුළම රා මැදීමේ යෙදෙන 35,000 කට අධික සංඛ්‍යාවක් සිටින බව අධ්‍යයනයෙන් හෙළි වේ.

කිතුල් ශාකය පිළිබඳ නිවැරදි සංඛ්‍යාලේඛන නොමැතිකම කර්මාන්තය පිළිබඳ සමස්ත අදහසක් ලබා ගැනීමට සහ ශ්‍රී ලංකාවේ කිතුල් වගාව දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීමට ඇති එක් බාධාවක් ලෙස සටහන් වී ඇත. එය විසඳිය යුතු ප්‍රධාන ප්‍රශ්නයකි. එසේම මෙම වගාව නඟා සිටුවීමට සහ එය යෝග්‍ය වගාවක් බවට පත් කිරීමට විධිමත් ආයතනයක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ.

විද්‍යාඥ සිරිමල් ප්‍රේමකුමාර (2015) පැවසුවේ කිතුල් යුෂය ලෝකයට ශ්‍රී ලංකාවේ මේපල් සිරප් විය හැකි බවයි. ඔහු වැඩිදුරටත් අවධාරණය කරන්නේ කිතුල් කර්මාන්තයට ජාත්‍යන්තර වෙළඳපොල වැඩි දියුණු කිරීමට සහ අත්පත් කර ගැනීමට ඉහළ හැකියාවක් ඇති බවයි. මෑතකාලීනව කිතුල් කර්මාන්තය කෙරෙහි අපගේ අවධානය යොමු නොවුණත් දේශීය වෙළෙඳපොළ පමණක් නොව ජාත්‍යන්තර වෙළෙඳපොළ ද ආකර්ෂණය කර ගැනීමේ හැකියාවද පවතී. ශ්‍රී ලංකාව කිතුල් නිෂ්පාදනයේ ප්‍රමුඛයා විය හැකි අතර ආදේශකයක් ලෙස මේපල් සිරප් සඳහා සාධාරණ තරගයක් ද ලබා දිය හැකි ය.

මෙම වගාව මානව සම්පත් සම්බන්ධ ගැටලු රැසකට මුහුණ දී සිටී. කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ දක්ෂ රා මදින්නන් නොමැතිකමයි. ශ්‍රී ලාංකීය සමාජය තුළ කර්මාන්තයට කිසිදු පිළිගැනීමක් නොමැති නිසා තරුණ පරම්පරාව කර්මාන්තයෙන් ඈත් වෙමින් පවතී. ඒ නිසා මේ වගාවේ යෙදෙන්නේ තරුණ පිරිසෙන් ඉතා සුළු පිරිසක් පමණයි. මේ ප්‍රශ්නය විසඳිය හැක්කේ අදාළ නිලධාරීන් විසින් මෙම වගාවට කිසියම් පිළිගැනීමක් ලබාදීමෙන් පමණි. මෙය වැඩිදියුණු කළ හැකි විභවතාවයන් සහිත වගාවකි. මෙම වගාව සමෘද්ධිමත් කිරීමට නම්, තරුණ පරම්පරාව ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම වගාවට ප්‍රසිද්ධියක් ලබා දිය යුතු අතර නව තාක්ෂණය හඳුන්වා දිය යුතු ය.

මෙය තනිකරම දැඩි ශ්‍රමයක් අවශ්‍ය වන රැකියාවක් බැවින් සුරක්ෂිතතාව සලකා බැලිය යුතු ප්‍රධාන කරුණකි. පරිශීලක-හිතකාමී රා මැදීමේ ක්‍රමයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. සංවර්ධිත රටවල් භාවිතා කරන නව තාක්ෂණය හඳුන්වා දීමෙන් මෙම ප්‍රශ්නයට විසඳුම් සෙවිය හැකි අතර, රා මදින්නන්ව ගස්වලට නැගීමේ දී ඇතිවන අනතුරු වළක්වා ගැනීම සඳහා ආරක්ෂිත කට්ටල ලබා දී ඔවුන්ගේ ආරක්ෂාව සහතික කළ යුතු ය.

කුඩා පරිමාණ නිෂ්පාදකයින් මුහුණ දෙන තවත් ප්‍රධාන ගැටලුවක් වන්නේ කිතුල් වගාවට පුළුල් වෙළෙඳපොළක් නොමැති වීම සහ දේශීය වෙළෙඳපොළට පවා නිෂ්පාදකයන් එතරම් විවෘත නොවීමයි. පිරිසිදු කිතුල් නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතින නමුත් නිෂ්පාදකයින් නිසි ලෙස වෙළෙඳපොළ සමඟ සම්බන්ධ වී නොමැත. එබැවින් ඒවා දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළට නිසි ලෙස සම්බන්ධ කළහොත් ශ්‍රී ලංකාවට ඉහළ විදේශ විනිමයක් උපයා ගත හැකි එක් ආකාරයක් වන අතර ඉබේම වගාවට පිළිගැනීමක්ද ලැබේ. අගය එකතු කළ නිෂ්පාදන වැඩි වශයෙන් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට නිෂ්පාදකයන් දිරිමත් කළ විට මෙම ගැටලුව නිරාකරණය වනු ඇත.

### 5.3.7 සමෘද්ධි සංවර්ධන වැඩසටහනේ වර්තමාන තත්ත්වය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 කාර්ය සාධන වාර්තාවට අනුව, ශ්‍රී ලාංකික ජනගහනය වන 21,670,000 අතුරින් සමෘද්ධි ප්‍රතිලාභීන් 1,384,021 ක් සිටින අතර එය ප්‍රතිලාභ ලබන ජනතාවගෙන් 6.9% ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ 21,203,000 ක ජනතාව අතුරින් 843,913 දිළිඳු ජනගහනය වන අතර සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,407,235 කි. (ශ්‍රී ලංකාවේ ජනගහනය, 2016). කෙසේ වෙතත්, 2020 සැප්තැම්බර් මාසය වනවිට දිස්ත්‍රික්ක 25 තුළ සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,781,689 කි. අනෙක් අතට සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් මිලියන 1.7 ක ජනතාවක් ප්‍රතිලාභ ලැබූහ. COVID-19 කාලය තුළ ව්‍යාපාර සහ ආදායම් අහිමි වූ, ශ්‍රී ලංකාවේ සහන වැඩසටහන මගින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව මිලියන 2.3 කි.

ශ්‍රී ලංකාවේ සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වූ මානව සම්පත් සංවර්ධන වැඩසටහන්වල අඩුවක් ඇත. දිළිඳු මිනිසුන් තුළ දිළිඳුකම පිටුදැකීමේ අරමුණු සහ ව්‍යවසායක මානසිකත්වය අතර පරතරයක් පවතී. ණය ප්‍රමාණවත් නොවීම දුප්පත්කම අඩු නොකරයි. ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ක්‍රමානුකූලව හඳුනාගැනීමේ ක්‍රමයක් අනුගමනය කරන නමුත් ව්‍යවසායකත්වය ඔස්සේ සිදුවන අධීක්ෂණය දුර්වලව ක්‍රියාත්මක වේ. ආරම්භක ව්‍යාපාර සංවර්ධනය, ව්‍යාපාර පුළුල් කිරීම සහ අලෙවිකරණය වැනි මානව සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් සමෘද්ධි අධිකාරිය විසින් හඳුන්වා දී ඇත.

සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 27,191 වන අතර පුරප්පාඩු සංඛ්‍යාව 1837 ක් හා දැනට සිටින සේවක සංඛ්‍යාව 25,515කි. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 22,611 ක් සිටින අතර 2011 සමෘද්ධි කළමනාකරුවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. (කාර්ය සාධන වාර්තාව, 2018)

කුරුණෑගල, ගම්පහ, රත්නපුර සහ මහනුවර දිස්ත්‍රික්කවල දත්තවලට අනුව වැඩිම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සිටින බවට වාර්තා වී ඇති අතර සමෘද්ධි වැඩසටහනින් පුද්ගලයින් 1,781,679 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත. 2018 සහ 2020 වසර වලට සාපේක්ෂව ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 374,444 කින් වැඩි වී ඇත.

**2018 සහ 2020 සමෘද්ධි ප්‍රතිලාභීන් සංසන්දනය කිරීම**




*රූපසටහන 1:* සමෘද්ධි ප්‍රතිලාභීන් සංසන්දනය කිරීම

2018 වර්ෂයේ දිස්ත්‍රික් වශයෙන් සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව




*රූපසටහන 2 : සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහනාධාර වර්ගීකරණය*

මූලාශ්‍රය: කාර්යසාධන වාර්තාව(2018), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

2020 සැප්. 21 දිනට දිස්ත්‍රික් ජනගහනය අනුව සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන




*රූපසටහන 3 : දිස්ත්‍රික් ජනගහනය අනුව සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන*

**සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ වර්තමාන තත්ත්වය**




*රූපසටහන 4 : 2020 සැප්. 21 දිනට ශ්‍රී ලංකාවේ සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන*

මූලාශ්‍රය: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2020 සැප්. 21

**සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන**




*රූපසටහන 5: සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන*

**සමෘද්ධි වැඩසටහනට අදාලව පවතින ගැටළු :**

1. **ප්‍රතිලාභීන් හඳුනාගැනීම**

❖ ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේදී දේශපාලන මැදිහත්වීම ප්‍රධාන භූමිකාවක්ව පවතී. උදා: නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමෘද්ධි කූපන් පත් නිකුත් කිරීම කාර්යක්ෂම සිදු නොවේ.
2019 ජුනි මස නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි ප්‍රතිලාභ ලබා ඇත්තේ 2.38%ක් පමණි. (ජනගහනය 245,402 අතුරින් සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන 5860 ක් වේ.)

2. **බැංකු ප්‍රමාණය අඩුවීම**

❖ සමෘද්ධි බැංකු ක්‍රමය ග්‍රාමීය ප්‍රදේශ දක්වා සේවාව පුළුල් කර නොමැත. උදා : නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ කලාපයේ කිලෝමීටර් 30 සිට 40 දක්වා දුර ගමන් ගෙවා සේවාව ලබා ගැනීමට ජනතාවට සිදු වී ඇත. එයට හේතුව බැංකු 35න් 10ක්ම ස්ථාපිතව තිබෙන්නේ නුවරඑළිය සහ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා තිබීමයි. වැවිලි හා ග්‍රාමීය අංශයේ විෂමතාවය අවම කිරීම සඳහා මෙම වැඩසටහන මඟින් ඔවුන්ගේ සේවය ප්‍රවලිත කළ හැකි ය. එසේම තරුණයන්, වැන්දඹුවන් සහ ආබාධිත පුද්ගලයන් වැනි ආන්තික කණ්ඩායම් කෙරෙහි සමෘද්ධි බැංකු ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැත.

3. **ඉලක්කගත කණ්ඩායම් සහ ණය**

❖ සමෘද්ධි වැඩසටහන සම්බන්ධයෙන්ම ගත්කළ දුර්වල ඉලක්කගත කිරීමද තවත් ප්‍රධාන දුර්වලතාවයක් වී ඇත.

මෙම දුර්වලතාවය මඟහරවා ගැනීම සඳහා ආරම්භක සහ උපරිම ණය මුදල වැඩි කිරීම, නිලධාරීන් සඳහා විධිමත්, ක්‍රමානුකූල සහ විධිමත් ඇගයීම් ක්‍රමයක් ඇති කිරීම සිදු කල හැක.

4. **පුහුණුව මද බව**

❖ සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ලැබෙන මානව සම්පත් සංවර්ධන පුහුණුව ප්‍රමාණවත් නොවීම සහ පුහුණු ක්‍රියාවලිය අදාළ කලාප විසින් නිරීක්ෂණය නොකිරීම. නිසි අඛණ්ඩ ව්‍යාපාර පුහුණුවක් නොමැති වීම. බොහෝ ප්‍රතිලාභීන් වයස අවුරුදු 50 ට වඩා වැඩිවීම නිසා පුහුණුව සඳහා සුදුසු නොවීම.

❖ චක්‍රලේඛ නියමිත වේලාවට ලබා දීම සහතික කරමින් කුඩා කණ්ඩායම්, ග්‍රාමීය සමිති, බැංකු සංගම් සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

❖ නිලධාරීන් විසින් නවීන තාක්ෂණය අනුගත කිරීම කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීමකි.

❖ මේ අතර, ඔවුන් සඳහා සමෘද්ධි බැංකු හරහා පහසුකම් සැලසෙන ණය යෝජනා ක්‍රමයක් ද තිබිය යුතු බවට නිලධාරීන් යෝජනා කළහ.

**නිර්දේශ :**

❖ ප්‍රතිලාභීන් හඳුනාගැනීම විධිමත්ව සිදු කිරීම. උදා: ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවීම

❖ පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම මගින් ප්‍රතිලාභීන්ගේ පුහුණුව සහ ඔවුන්ගේ මානව සම්පත් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ හැකි ය.

❖ සමෘද්ධි බැංකු සමිතිය නවීකරණය කර දිස්ත්‍රික්ක විෂමතාවයකින් තොරව ඔවුන්ගේ සේවය පුළුල් කිරීම.

❖ සමෘද්ධි අධිකාරිය මගින් ප්‍රතිලාභීන්ගේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පුහුණු ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම හා පුහුණු වැඩසටහන සහ ව්‍යවසායකයින් ඇගයීම සිදු කළ හැක.

❖ ග්‍රාමීය ප්‍රදේශවලද සමෘද්ධි බැංකු මගින් ඔවුන්ගේ සේවාව පුළුල් කිරීම. උදා; නුවරඑළිය

❖ දෙපාර්තමේන්තුව මගින් සේවක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගත යුතුය.

❖ සමෘද්ධි බැංකු පද්ධතිය ඩිජිටල්කරණය කර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවි කිරීම

❖ ණය මුදල වැඩි කිරීම සහ ප්‍රතිලාභීන්ව ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික බැංකු සම්බන්ධ කිරීම නිර්දේශ කිරීම

❖ දේශපාලන මැදිහත්වීමකින් තොරව කාර්යයන් සිදු කිරීම සොයා බැලීම

### 5.3.8 ශ්‍රී ලංකාවේ සමුපකාර සංවර්ධනය පිළිබඳ තත්ත්ව වාර්තාව

**සමුපකාර සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සන්දර්භය :**

සමූපකාර තුළින් ඉන්දියාවේ රැකියා මිලියන 13.8 කට අධික ප්‍රමාණයක් නිර්මාණය කර ඇති අතර රැකියා වලින් 92% ක් කම්කරු සමුපකාර හරහා ස්වයං රැකියා ඔස්සේ නිර්මාණය කර ඇත. ජපානයේ, පාරිභෝගික සමුපකාර ව්‍යාපාරය 1997 දී පූර්ණ කාලීන රැකියා 58,281 ක් සහ අර්ධකාලීන රැකියා 95,374 ක් ඇති කළේ ය. පූර්ණ කාලීන රැකියා සංඛ්‍යාව පෙර වසරට වඩා 409 කින් අඩු වුව ද, අර්ධකාලීන තනතුරු සංඛ්‍යාව 4.4% කින් වැඩි වී ඇත. කොරියානු ජනරජයේ, කෘෂිකාර්මික සමුපකාර ව්‍යාපාරය සමූහාණ්ඩු මට්ටමින් 17,448 ක් සහ සාමාජික සමුපකාර මට්ටමින් ද අතිරේක කාර්ය මණ්ඩලය 53,698 ක් ද 1997 වසර අවසානයේ සේවය කර ඇත. ශ්‍රී ලංකාවෙහි 1977 වසරේ දී සමුපකාරය රැකියා 37,617 ක් සඳහා වගකිව යුතු විය. පිලිපීනයේ, ජාතික ශ්‍රම බලකායට සමුපකාර අංශයේ දායකත්වය 1997 දී සමස්ත රැකියා වෙළඳපොලෙන් මිලියන 5.01ක් හෙවත් 16.24%ක් බව ඇස්තමේන්තු කර ඇත. 2000 වසර වන විට සමුපකාර මගින් රැකියා මිලියන 20කට අධික ප්‍රමාණයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. (COPAC, 1999 මැයි 17-28, සමුපකාර ප්‍රවර්ධනය සහ උන්නතිය සඳහා වූ කමිටුව).

**සමුපකාර සමිතිවල පවත්නා තත්ත්වය**




*1රූපය: ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති*

ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයට දීර්ඝ ඉතිහාසයක් තිබේ. 2012 දී සමිති 14,985 ක් පැවති අතර 2016 දී සමිති සංඛ්‍යාව 12,379 දක්වා අඩු වී ඇත. 2013 ට සාපේක්ෂව 2014 දී සමුපකාර සමිති සංඛ්‍යාව 257 කින් වැඩි වී ඇති බව 1 රූප සටහනින් පෙන්නුම් කරයි.

**ශ්‍රී ලංකාවේ සමුපකාර සමිතිවල සාමාජිකයින් සංඛ්‍යාව**




*2 රූපය : ශ්‍රී ලංකාවේ සමුපකාර සමිතිවල සාමාජිකයින් සංඛ්‍යාව*

2 වන රූප සටහනට අනුව, සමුපකාර සමිතිවල ශ්‍රී ලංකාවේ සාමාජිකයින් ගණන මිලියන 8.8 ක් වේ. මෙය ශ්‍රී ලංකාවේ විශාලතම සාමාජික ව්‍යාප්තියකි. මෙම සංඛ්‍යාලේඛනයෙන් පෙන්නුම් කරන්නේ සමිති සමඟින් පවතින පුද්ගල මැදිහත්වීමයි. සාමාජික සංඛ්‍යාව ආකර්ෂණීය කරුණක් වුවත් ඔවුන්ගේ ක්‍රියාකාරී නිෂ්පාදන සහභාගීත්වය රටේ සංවර්ධනය වඩාත් වැදගත් වේ.

**සංවිධාන, සාමාජිකයින් සහ රැකියා සංඛ්‍යාව :**

1 වගුව : **සමිති, සාමාජිකයින් සහ රැකියා සංඛ්‍යාව**

| | සංවිධානයේ ස්වභාවය | සංවිධාන සංඛ්‍යාව | ක්‍රියාකාරී සංවිධාන සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | සෘජු රැකියා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | පළාත් ප්‍රාතමික මට්ටමේ සමූපකාර සමිති | 12,130 | 7,857 | 8,380,964 | 35,373 |
| 2 | සමස්ත ලංකා ප්‍රාතමික මට්ටමේ සමූපකාර සමිති | 59 | 36 | 408,543 | 1154 |
| 3 | ද්විතීයික සමූපකාර සංවිධාන | 174 | 143 | 9,443 | 2064 |
| 4 | තෘතීයික සමූපකාර සංවිධාන | 16 | 11 | 1,447 | 361 |
| | **එකතුව** | **12,379** | **8,047** | **8,800,397** | **38,952** |

ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති 12,379කින් ක්‍රියාකාරී මට්ටමේ සමිති 8,047ක් වේ. කෙසේ වෙතත්, සමිති 4,332 ක් සක්‍රීයව ක්‍රියාත්මක නොවේ. එම සමිති ක්‍රියාත්මක වීම හෝ නොවීම පිළිබඳ දත්ත නොපවතී. ශ්‍රී ලංකාවේ සමූපකාර සංවර්ධනයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමට විශේෂ අධ්‍යයනයන් සිදු කිරීම යෝග්‍ය වනු ඇත. ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සමුපකාර සමිති 12,130ක් පවතී. (සංඛ්‍යා ලේඛන වාර්තාව - 2016, 2016).

**සමුපකාර අංශයේ රැකියා :**

1 වගුව : ශ්‍රී ලංකාවේ සමුපකාර සමිතිවල සෘජු රැකියා

| ස්ත්‍රී පුරුෂභාවය | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුරුෂ | 23,477 | 23,507 | 16,879 | 15,445 | 20,281 | 20,865 | 20,207 | 13,911 | 35.71% |
| **ස්ත්‍රී** | 28,220 | 27,009 | 23,501 | 23,329 | 25,694 | 22,989 | 25,595 | 25,041 | 64.28% |
| **Total** | **51,697** | **50,516** | **40,380** | **38,774** | **45,975** | **43,854** | **45,802** | **38,952** | **100%** |

2009 සහ 2016 වර්ෂයන්හි දී සමූපකාර සමිතිවල සෘජු රැකියා සංඛ්‍යාව පිළිවෙලින් 51,697 සහ 38,952 ක් බව 2 වන වගුවෙන් සහ 3 වන රූප සටහනෙන් පෙන්නුම් කෙරේ. සමුපකාර දෙපාර්තමේන්තුව යටතේ සේවකයින් 64% ක් ද සේවිකාවන් 36% ක් ද සේවයේ නිරත වී සිටිති. දත්ත වලට අනුව 2016 වසරට සාපේක්ෂව 2009 වසරේ දී පිරිමි සේවක අනුපාතය දස දහසකින් අඩු වී ඇත.

**සෘජු සේවා නියුක්තිය**




*3 රූපය : සෘජු සේවා නියුක්තිය*

**ශ්‍රී ලංකාවේ සමූපකාර අංශයේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් :**

සේවකයින්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන තුනක් රට තුළ පවතී.

- ❖ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය
- ❖ සමූපකාර පුහුණු මධ්‍යස්ථානය උතුරු පළාත - වවුනියාව
- ❖ සමූපකාර පුහුණු මධ්‍යස්ථානය, නැගෙනහිර පළාත - කල්මුණේ

2019 වසරේ උතුරු පළාත් පුහුණු මධ්‍යස්ථානය මගින් පුහුණු වැඩසටහන් 16ක් පවත්වන ලදී. මෙම පුහුණුව ඉලක්ක කරන ලද්දේ සමූපකාර කාර්යාලයේ සේවය කරන කාර්ය මණ්ඩලය 998ක් සඳහා පමණි. පහත සඳහන් ක්ෂේත්‍ර පුහුණුව මගින් ආවරණය කරන ලදී; සමුපකාර අංශය පිළිබඳ දැනුම, විගණන පද්ධතිය, අලෙවිකරණය, ව්‍යාපාර ප්‍රවර්ධනය, ඵලදායී මූල්‍ය පද්ධතිය, තීරණ ගැනීම, පුහුණුව සඳහා සම්පත් සහ ව්‍යාපාර වර්ධනයේ ස්ථායිතාවය.

**සමූපකාර සංවර්ධන ගැටළු :**

❖ **පුහුණුව**

සමූපකාර පුහුණු මධ්‍යස්ථාන සියලුම සේවකයින් සඳහා පුහුණුව ලබා දෙන නමුත් සියළුම සාමාජිකයින් සඳහා එම පුහුණුව නොලැබේ. වවුනියාවේ පළාත් සමුපකාර පුහුණු ආයතනය මගින් සමුපකාර සේවකයින් සහ සාමාජිකයින් සඳහා දෙමළ මාධ්‍ය පුහුණු කිරීම් කිහිපයක් පවත්වා ඇත. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (NICD) සමුපකාර සංවර්ධන නිලධාරීන්, ශාඛා කළමනාකරුවන් සහ අනෙකුත් නිලධාරීන් වැනි සමුපකාර සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එබැවින් අදාළ ආයතනවලට මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ඔවුන්ගේ පුහුණුව පුළුල් කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ සමුපකාර දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව 38,952 කි. එය 2009 දී රැකියා 51,691 ක් ලෙස ගණනය කර තිබුණි. වසර ගණනාවකට පසු එම අගය 2016 වසරේ දී 38,952 කින් අඩු වී ඇත. රැකියා අහිමි වීම, විරැකියාවට හේතුවක් වනු ඇත.

- ❖ සමුපකාර සමිති බාහිර පාර්ශව විසින් විගණනය නොකරන බැවින් එය අන් අයගේ විවේචනයට ලක් වනු ඇත
- ❖ පුද්ගලික ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සීමා කිරීම සහ සමුපකාර සමිති පිහිටුවීම දිරිමත් කිරීම
- ❖ කෘෂිකර්මාන්තය, බතික්, ගම්මිරිස් සහ කිතුල් ආදිය සඳහා සිදුකරන ආයෝජනවල හිඟ බව
- ❖ සමුපකාර බැංකු තවමත් සාම්ප්‍රදායික සහ අතින් සිදුකරන ක්‍රම භාවිතා කරයි. බැංකු කුඩා සංඛ්‍යාවක් පමණක් ඔවුන්ගේ ක්‍රියාකාරකම් නවීකරණය කිරීම සිදු කරයි. ග්‍රාමීය බැංකු තම ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට කිසිවක් සිදු නොකරයි.
- ❖ සමුපකාර දෙපාර්තමේන්තුව දිවයින පුරා සිය සේවාවන් සපයන නමුත් එය ග්‍රාමීය, වතු සහ ආන්තික ප්‍රජාවන් සඳහා ප්‍රමාණවත් නොවීම.

- ❖ බොහෝ සමුපකාර සමිති, සංචාරක ව්‍යාපාරය සහ ණය සේවා වැනි ජාතික නිෂ්පාදනය සඳහා ආයෝජනය කිරීමට උනන්දුවක් නොමැති අතර සේවාවන් සිදු කරලීමට කැමැත්තක් දක්වයි.
- ❖ දේශපාලනීකරණය හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල සමාජ දූෂණයට හෝ අක්‍රිය කිරීමට බලපාන අතර මධ්‍යගත වීම සුමට ක්‍රියාකාරිත්වයට තර්ජනයක් විය හැකිය.

**නිර්දේශ : -**

**රැකියාව :**

- ❖ මෙම කර්මාන්තයට රැකියා අහිමි වීමට හේතුව සහ කෙසේ සිදුවිද ? රජයට කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා උනන්දුවක් ඇති කර ඒ සඳහා ආයෝජනය කළ හැකි නම් එය තරුණ තරුණියන්ට රැකියා උත්පාදනය කිරීමක් වනු ඇත. මෙම කර්මාන්තය තුළ 2016 වසරේ කාන්තා ශ්‍රම බලකායක් 65% ක් වූ අතර, ඔවුන්ගේ සමිතිවල මූල්‍ය හැකියාවන් සවිබල ගන්වා ශක්තිමත් කළහොත් ශ්‍රී ලංකාව තුළ රැකියා අවස්ථා වැඩියෙන් නිර්මාණය වනු ඇත.

**පුහුණුව :**

- ❖ දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සුළු ප්‍රමාණයක් වන අතර එය මුළු දිවයිනේම ඉල්ලීම් ඉටු කිරීමට ප්‍රමාණවත් නොවේ. එයින් අදහස් වන්නේ දිස්ත්‍රික් මට්ටමින් ද්විත්ව මාධ්‍ය (සිංහල සහ දෙමළ) පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා වඩාත් කාර්යක්ෂමව ඉටු කළ යුතු බවයි.

  පුහුණු වැඩසටහන් සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මෙන්ම ප්‍රතිලාභීන් වෙත ද ව්‍යාප්ත කළ හැකිය. බොහෝ පුහුණු වැඩසටහන් ඔවුන්ගේ සේවකයින් ඉලක්ක කර ගනී. එය සාමාජිකයින් අභිමතය පරිදි සිදු කරනු ලබන්නේ නම් එම උත්සාහය ඵලදායී වනු ඇත. සමුපකාර සංවර්ධන නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් පවත්වනු ලබන පුහුණුව, **TOT** පුහුණුව දක්වා නැවත සංවිධානය කළ හැකි අතර එය ප්‍රායෝගික උපාය මාර්ගයක් ලෙස එය වඩාත් ඵලදායී වනු ඇත.

**අධ්‍යයන සහ පර්යේෂණ :**

- ❖ සමූපකාර සමිතිවල දුර්වලතා හඳුනාගෙන ග්‍රාමීය ප්‍රදේශවල සහ වතු ක්ෂේත්‍රවල අධ්‍යයන හා පර්යේෂණ තුළින් ඔවුන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීම. අදාළ බලධාරීන්**,** දෙපාර්තමේන්තුව විසින් සමුපකාර සමිතිවල පවතින දුර්වලතා හඳුනාගෙන ඔවුන්ගේ ධාරිතාව ග්‍රාමීය ප්‍රදේශවල සහ වතුකර අංශ දක්වා ශක්තිමත් කළ හැකිය. වතු ජනතාවගෙන් බොහොමයකට සමූපකාර සමිති පිළිබඳ දැනුම අඩු මට්ටමක පවතී. දත්ත මඟින් පෙන්වා දෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවා ඇති සමිතිවල අඩුකම සහ සාමාජිකයින් සමුපකාර සමිති කෙරෙහි උනන්දුවක් නොදැක්වීමයි.

**නව කර්මාන්ත :**

- ❖ බතික්, ගම්මිරිස් සහ කිතුල් යනාදී දේශීය නිෂ්පාදන කර්මාන්ත ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම. සමූපකාර දෙපාර්තමේන්තුව සහ වාණිජ මණ්ඩලය සමඟ සම්බන්ධව කටයුතු කිරීම ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ග්‍රාමීය සමුපකාර සමිතිවලට හොඳ බලපෑමක් ඇති කරන්නකි.

**ඩිජිටල්කරණය සහ පරිශීලක හිතකාමීබව :**

- ❖ **ATM** කාඩ්පත් හඳුන්වා දීම සහ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල බැංකු පද්ධතිය නවීකරණය කිරීම, ඩිජිටල්කරණය කිරීම පාරිභෝගිකයින් සහ පරිශීලකයින් සඳහා වැඩි ආකර්ෂණයක් ඇති කරයි. එබැවින් සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැරවීමට වගබලා ගැනීම වඩාත් සුදුසු ක්‍රමයකි. කෝප්සිටි අලෙවිහල් ශක්තිමත් කිරීම සහ **ATM** සහ ක්‍රෙඩිට් කාඩ් පද්ධතිය හඳුන්වා දීම මෙන්ම රට පුරාම ක්‍රියාත්මක වන සමූපකාර අලෙවි මධ්‍යස්ථාන නවීකරණය කිරීම

**යහපාලන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :**

- ❖ සමූපකාර සමිතිවල ගිණුම් තෙවන පාර්ශවයකට හෝ බාහිර පාර්ශ්වයකට විගණනය කළ හැකි අතර එය විනිවිදභාවයකින් යුක්ත වනු ඇත. පද්ධතිය දූෂිත කළ නොහැකි අතර සෑම සමාජයක්ම වගවීම, වගකීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ නීතියේ ආධිපත්‍යය වැනි යහපාලන භාවිතයන් ක්‍රියාත්මක කරයි.

**දේශපාලන මැදිහත්වීමෙන් තොර වීම :**

- ❖ සමුපකාර සඳහා ව්‍යාපාරික නිදහස ලබා දීමට අදාළව පළාත් ආණ්ඩු සමඟ සහයෝගයෙන් සමුපකාර නීතිය වෙනස් කිරීම. සමාජයක් තුළ බලතල නිසි ආකාරයෙන් විමධ්‍යගත කරන අතරතුර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සහ සමිතිවලට දේශපාලනීකරණයෙන් තොරව ක්‍රියා කළ හැකි බවට සහතික වීම.

**සේවාව පුළුල් කිරීම :**

- ❖ ඔවුන්ගේ සේවාවන් හා කාර්යමණ්ඩලය දීපව්‍යාප්ත කළ යුතු ය. උදා: වැවිලි අංශයේ පවතින සමූපකාර සමිති නිවාස අරමුණු සඳහා පමණක් පිහිටුවා ඇත. කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය හා එළවළු භෝග සඳහා වැඩි විභවතාවයක් පවතී. ආන්තික ප්‍රජාවන් සඳහාද අදාළ දෙපාර්තමේන්තුවේ සේවාව ව්‍යාප්ත කළ යුතුය.

- ❖ කෘෂිකාර්මික, කිරි නිෂ්පාදන, ධීවර හා සුළු භෝග නිෂ්පාදන යන ක්ෂේත්‍රවල සංවර්ධිත සහ පුළුල් නිෂ්පාදන සමුපකාර පද්ධතියක් ස්ථාපිත කිරීම.

- ❖ කලාපීය සහ ජාත්‍යන්තර සමුපකාර සමිතිය සමඟ බැඳීමක් ඇති කර ගැනීම

## 5.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ ව්‍යවසායකයින් බිහි කිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය අංශයේ තීරණාත්මක ගැටළුවකි. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් පළාත් සභා අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවයෙන් මෙම අංශයේ නියැලී සිටින ව්‍යවසායකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පාඨමාලා මොඩියුලයක් නිර්මාණය කරන ලදී. මෙම පාඨමාලාව තුළින් අපද්‍රව්‍ය ගැටළුවට දිගුකාලීන විසඳුම් සෙවීමට සහ මෙම අංශයේ නව වෘත්තීය මාර්ග ව්‍යවසායකයින් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ. මෙම පාඨමාලාවේ නියමු වැඩසටහනක් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් 2019 ඔක්තෝම්බර් 20 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවසායක දෙපාර්තමේන්තුවේදී දියත් කරන ලදී.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ තාක්ෂණික දැනුම හා මනා කළමනාකරණ කුසලතා ඇති ව්‍යවසායකයින් බිහිකිරීම සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය. තවද, වැඩසටහන පහත සඳහන් නිශ්චිත අරමුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- ව්‍යවසායකත්ව මුලපිරීම් වර්ධනය කිරීමට මානසිකත්වයක් ගොඩ නැගීම
- විධිමත් ව්‍යාපාර ක්‍රියාවලීන් පිළිබඳව දැනුවත් කිරීම
- සාම්ප්‍රදායික පන්ති කාමර ඉගෙනීමෙන් බැහැරව අවශ්‍ය කළමණාකරණ දැනුවත් කිරීමේ සංකල්ප/න්‍යායන් සහ ප්‍රායෝගික අංශයන් ඇති කිරීම සඳහා වැඩමුළු/පුහුණුව හඳුන්වාදීම.

පළාත් සභා අමාත්‍යාංශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත් සභා ආවරණය වන පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් තෝරා ගන්නා ලදී. න්‍යායාත්මක සහ ප්‍රායෝගික සැසි සාර්ථකව නිම කිරීමට හැකිවන සෑම සහභාගිවන්නෙකුටම වටිනා සහතිකයක් ප්‍රදානය කෙරේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ නියැලී සිටින ව්‍යවසායකයින්ට මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වනු ඇති අතර දැනට සහභාගිවන්නන් 22 දෙනෙකු ව්‍යවසායකත්වය, කළමනාකරණය සහ තාක්ෂණික දැනුම පිළිබඳ දැනුම ගවේෂණය කරමින් පාඨමාලාව හදාරණ අතර ඔවුන්ට මෙම පුහුණුව තුළින් තම ව්‍යාපාරය තවදුරටත් දියුණු කර ගැනීමට රුකුලක් වනු ඇත. එසේම පාඨමාලාවේ ප්‍රමිතිය නංවාලීම සඳහා සුදුසු ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

### 5.5 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංඛ්‍යාන අත්පොත

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ දැක්ම අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් අදාළ පාර්ශවකරුවන්ගේ තොරතුරු පරතරය සපුරාලීම පිණිස වාර්ෂිකව සංඛ්‍යාන අත්පොතක් පළ කිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ කළමනාකාරිත්වය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් 2015 වර්ෂයේ සිට ප්‍රකාශන 4 ක් පළ කර ඇති අතර නවතම ප්‍රකාශය 2020 වර්ෂයේ දී පළකර ඇත.

මෙම තොරතුරු ප්‍රකාශන තුළ සාමාන්‍ය අධ්‍යාපනය, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අංශවලට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන දත්ත ඇතුළත් වේ. වෙබ් අඩවියේ ඇති ද්විතීයික දත්ත මූලාශ්‍ර, ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංඛ්‍යාලේඛන ආදිය මත පදනම්ව සියලු දත්ත එක්රැස් කරන ලදී. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය කෙරෙහි උනන්දුවක් දක්වන පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙම ප්‍රකාශනයේ දත්ත වැදගත් වනු ඇත.

## 6. 2020 වර්ෂය තුළ පළ කරන ලද ප්‍රකාශන -

ප්‍රකාශනවල පින්තූර සහ 2020 වර්ෂය තුළ පළ කරන ලද වාර්තා පහතින් දැක්වේ.




කොවිඩ් -19 අධ්‍යයන වාර්තාව




සංඛ්‍යාන අත්පොත - 2020

## 7. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2020 දෙසැම්බර් 31 දිනට**

ශ්‍රී.ලං.රු.

| | සටහන | 2020 | | 2019 | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| **ජංගම වත්කම්** | | | | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | 1 | 17,476,958.89 | | 17,297,237.12 | | 17,000,000.00 |
| ලැබීම් | 2 | 40,062.82 | | 40,062.82 | | 41,000.00 |
| භාණ්ඩ තොග | 3 | 788,136.66 | | 679,542.34 | | 700,000.00 |
| පෙර ගෙවීම් | 4 | 84,468.92 | | 270,413.02 | | 85,000.00 |
| අනෙකුත් ජංගම වත්කම් | 5 | 3,319,639.45 | | 3,271,452.39 | | 3,506,125.00 |
| | | **21,709,266.63** | | **21,558,707.69** | | **21,332,125.00** |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 6 | 9,950,577.86 | | 11,355,967.56 | | 10,000,000.00 |
| මෝටර් රථ | 6 | 1,449,060.65 | | 4,450,549.22 | | 1,500,000.00 |
| මaදුකාංග | | 221,400.83 | | 324,653.33 | | 222,000.00 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 6 | 418,540.63 | | 531,137.56 | | 156,962.60 |
| | | 12,039,579.97 | | 16,662,307.67 | | 11,878,962.60 |
| අනෙකුත් වත්කම් | | **33,748,846.60** | | **38,221,015.36** | | **33,211,087.60** |
| **වගකීම්** | | | | | | |
| වත්කම් වගකීම් | | | | | | |
| ගෙවිය යුතු | 7 | 1,718,483.37 | | 970,682.65 | | 1,797,562.28 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 8 | 1,116,242.82 | | 890,292.82 | | 850,230.00 |
| | | **2,834,726.19** | | **1,860,975.47** | | **2,647,792.28** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| සේවක ප්‍රතිලාභ | 9 | 3,621,267.50 | | 3,323,854.88 | | 3,000,000.00 |
| | | **3,621,267.50** | | **3,323,854.88** | | **3,000,000.00** |
| **මුළු වගකීම්** | | **6,447,993.69** | | **5,184,830.35** | | **5,647,792.28** |
| **ශුද්ධ වත්කම්** | | **27,292,852.91** | | **33,036,185.01** | | **27,563,295.32** |

## ශුද්ධ වත්කම් /ස්කන්ධය

| | | | |
|---|---|---|---|
| දායක වූ ප්‍රාග්ධනය | | | |
| දායකකළ ප්‍රාග්ධනය | 3,000,000.00 | 3,000,000.00 | 3,000,000.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | 13,490,249.80 | 13,490,249.80 | 13,490,249.80 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 10,073,045.52 | 10,073,045.52 | 10,073,045.52 |
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | 729,557.59 | 6,472,889.69 | 1,000,000.00 |
| **මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය** | **27,292,852.91** | **33,036,185.01** | **27,563,295.32** |

ඉහත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන බව සහතික කරමි.

සුජීවා කළුආරච්චි
සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
දිනය : 2021/07/06

5 සිට 16 දක්වා පිටු වල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

සභාපති
දිනය: 2021/07/14

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
දිනය: 2021/07/14

සභාපති
මානව සම්පත් සංවර්ධනය තිරිණේ ශ්‍රී ලංකා ජාතික සභාව
අංක: 354/2, 7 වන මහල, "නිපුණතා පියස"
ඇල්ප්ටිගල මාවත, නාරාහේන්පිට කොළඹ 05

ආචාර්ය කේ. ඒ. ලලිතසිර
අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
"නිපුණතා පියස"
3 වන මහල, අංක 354/2, ඇල්ප්ටිගල මාවත,
කොළඹ 05.

## 8. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

*ශ්‍රී.ලං.රු.*

| | *සටහන* | **2020** | | **2019** | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 21,897,323.00 | | 23,408,216.00 | | 21,900,000.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | 2,800,000.00 | | 11,957,054.86 | | 8,000,000.00 |
| විදේශීය පුහුණු වැඩසටහනේ අතිරික්තය/හිඟය | 12 | (981,600.00) | | (671,900.07) | | - |
| වත්කම් බැහැර කිරීමේ දී ලාභය / (අලාභය) | 13 | - | | (2,740.00) | | - |
| අනිකුත් ආදායම් | 14 | 168,596.53 | | 501,760.20 | | 130,000.00 |
| **මුළු ආදායම** | | **23,884,319.53** | | **35,192,390.99** | | **30,030,000.00** |
| **වියදම්** | | | | | | |
| පඩිනඩි, වැටුප් හා සේවක ප්‍රතිලාභ | 15 | 18,994,355.02 | | 18,907,777.29 | | 18,463,002.00 |
| ප්‍රදාන හා අනෙක් මාරුකළ ගෙවීම් | 16 | 1,149,949.66 | | 6,775,338.37 | | 1,990,000.00 |
| සැපයුම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 17 | 147,166.68 | | 673,257.71 | | 588,560.00 |
| ක්ෂය කිරීමේ හා ක්‍රමක්ෂය වියදම | 6 | 4,624,227.70 | | 5,181,716.49 | | - |
| ගමන් වියදම්, යැපීම් හා දීමනා | 18 | 289,597.01 | | 332,197.20 | | 53,000.00 |
| උපයෝගිතා සහ සේවා | 19 | 2,833,983.62 | | 3,557,029.81 | | 1,945,650.00 |
| නඩත්තු වියදම් | 20 | 1,203,171.94 | | 959,740.60 | | 728,520.00 |
| අනෙකුත් වියදම් | 21 | 385,200.00 | | 657,588.83 | | 39,000.00 |
| **මුළු වියදම්** | | **29,627,651.63** | | **37,044,646.30** | | **23,807,732.00** |
| **කාලච්ඡේදය සඳහා අතිරික්තය /(හිඟය)** | | **(5,743,332.10)** | | **(1,852,255.31)** | | **6,222,268.00** |

## 9. ශුද්ධ වත්කම්/ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** *ශ්‍රී.ලං.රු.*

| පාලන ආයතනයේ හිමිකරුවන්ට බෙදීයාම | | | | | |
|---|---|---|---|---|---|
| | **දායක ප්‍රාග්ධනය** | **ප්‍රත්‍යාගණන සංචිත** | **රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය** | සමුච්චිත අතිරික්තය/ (හිඟය) | මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය |
| 2019 ජනවාරි 01 දිනට ප/ගේ ශේෂය | 3,000,000.00 | 13,490,249.80 | 15,780,100.38 | 7,946,035.00 | 40,216,385.18 |
| බැහැරකළ වත්කම් මත ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - |
| පෙර වර්ෂයේ ගැලපීම | - | - | - | 379,110.00 | 379,110.00 |
| රජයේ ප්‍රදාන - ආදායම වෙත මාරු කිරීම | | | (6,775,338.37) | | (6,775,338.37) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය/හිඟය/ අතිරික්තය තුළ සෘජුවම හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 6,250,000.00 | - | 6,250,000.00 |
| ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත පෙර ප්‍රත්‍යාගණන අතිරික්තය හඳුනා නොගැනීම | - | - | (5,181,716.49) | - | (5,181,716.49) |
| විලම්භිත ආදායම | - | - | | - | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය | - | - | - | (1,852,255.31) | (1,852,255.31) |
| කාලපරිච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම සහ වියදම් | - | - | (5,707,054.86) | 1,473,145.31 | 7,180,200.17 |
| **2019 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **3,000,000.00** | **13,490,249.80** | **10,073,045.52** | **6,472,889.69** | **33,036,185.01** |
| 2020 ජනවාරි 01 දිනට ප/ගේ ශේෂය | 3,000,000,.00 | 13,490,249.80 | 10,073,045.52 | 6,472,889.69 | 33,036,185.01 |
| පෙර වසරේ ගැලපීම | - | - | - | - | - |
| බැහැරකළ වත්කම් මත ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - |
| රජයේ ප්‍රදාන - ආදායම වෙත මාරු කිරීම | - | - | (1,149,949.66) | - | (1,149,949.66) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය/හිඟය/ අතිරික්තය තුළ සෘජුවම හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | | - | - |
| විලම්භිත ආදායම | - | - | (2,800,000.00) | - | (2,800,000.00) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය | - | - | (1,650,050.34) | (5,743,332.10) | (7,393,382.44) |
| කාලපරිච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම සහ වියදම් | - | - | | | |
| **2017 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **3,000,000.00** | **13,490,249.80** | **10,073,045.52** | **729,557.59** | **27,292,852.91** |

## **10.** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | **2020** | | **2019** |
|---|---|---|---|
| අතිරික්තය/ (හිඟය) | (5,735,332.10) | | 1,852,255.31 |
| <u>මුදල් නොවන චලනයන්</u> | | | |
| ක්ෂයකිරීම් | 4,624,227.70 | | 5,181,716.49 |
| පාරිතෝෂික වියදම් | 539,700.12 | | 919,607.88 |
| අධි ප්‍රතිපාදන ආපසු යැවීම | - | | - |
| විලම්භිත ආදායම | - | | (5,181,716.49) |
| වර්ෂාවසාන ප්‍රතිපාදන | - | | - |
| සේවක ණය මත පොළි | (112,136.56) | | (129,504.85) |
| විගණන ගාස්තුව | 225,950.00 | | 438,150.00 |
| වත්කම් කපාහැරීම | | | 155,039.13 |
| දේපල, පිරියත හා උපකරණ අලෙවිය මත (ලාභ)/අලාභ | | | 2,740.00 |
| පරිභෝජන සංචිතවල වැඩිවීම් (අඩුවීම්) | (108,594.32) | | (17,801.98) |
| පෙර ගෙවුම්වල වැඩිවීම් (අඩුවීම්) | 185,944,10 | | 8010.19 |
| සේවක ණයවල වැඩිවීම් (අඩුවීම්) | (60,787.06) | | (272,747.46) |
| අනෙකුත් අත්තිකාරම්වල වැඩිවීම් (අඩුවීම්) | 10,000.00 | | (1,250.00) |
| ගෙවීමට ඇති දෑ හි වැඩිවීම් (අඩුවීම්) | 739,800.72 | | (243,784.47) |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම් | - | | - |
| ලැබීම්වල වැඩිවීම් (අඩුවීම්) | - | | - |
| ලැබිය යුතු වත්කම් මිලදී ගැනීම් වල වැඩි වීම/අඩුවීම | 2,600.00 | | 1,570.00 |
| ගෙවූ විගණන ගාස්තුව | | | |
| ගෙවන ලද පාරිතෝෂික | (242,287.50) | | (96,687.50) |
| රජයේ ප්‍රදාන | | | (489,734.41) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **69,085.10** | | **(1,578,648.78)** |

| | 2020 | | 2019 |
|---|---|---|---|
| **ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| කාර්යාල උපකරණ මිලදි ගැනීම | - | | - |
| පරිගණක මිලදි ගැනීම | - | | - |
| මෝටර්රථ මිලදි ගැනීම | | | (807,442.85) |
| සේවක ණය මත පොළිය | 112,136.56 | | 129,504.85 |
| මෘදුකාංග මිලදි ගැනීම | | | (65,000.00) |
| පොත් මිලදි ගැනීම | (1,500.00) | | (33,245.20) |
| වෙනත් වත්කම් මිලදි ගැනීම | | | (219,900.00) |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | | | 4,460.00 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(110,636.56)** | | **991,623.20** |
| | | | |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ | - | | - |
| මුදල් හා මුදලට සමාන දැ තුළ ශුද්ධ වැඩිවීම් (අඩුවීම්) | 179,721.00 | | 2,570,271.98 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දැ | 17,297,237.12 | | 19,867,509.10 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදලට සමාන දැ | **17,476,958.78** | | **17,297,237.12** |
| | | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන්** | | | |
| අතැති මුදල් සහ බැංකු සමග ශේෂ | | | |
| ලංකා බැංකු ගිණුම 165197 | 17,380,095.96 | | 17,252,519.88 |
| මහජන බැංකු ගිණුම් අංකය 119100120409161 | 96,862.82 | | 44,717.73 |
| | **17,476,958.78** | | **17,297,237.12** |

11. සටහන්

| | | 2020 | | 2019 | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| **මුදල් හා මුදලට සමාන දෑ** | **1** | | | | | |
| ලංකා බැංකු ගිණුම 165197 | | 17,380,095.96 | | 17,252,519.88 | | 17,000,000.00 |
| මහජන බැංකු ගිණුම් අංකය 119100120409161 | | 96,862.24 | | 44,717.24 | | 100,000.00 |
| | | **17,476,958.78** | | **17,297,237.12** | | **17,000,000.00** |
| **ලැබිය යුතු** | **2** | | | | | |
| නිමල් බොපගේ (හිටපු සභාපති) | | 40,062.82 | | 40,062.82 | | 41,000.00 |
| | | **40,062.82** | | **40,062.82** | | **41,000.00** |
| **භාණ්ඩ තොග** | **3** | | | | | |
| පරිභෝජන භාණ්ඩ ගබඩා | | 788,136.66 | | 679,542.34 | | 700,000.00 |
| | | **788,136.66** | | **679,542.34** | | **700,000.00** |
| **පෙර ගෙවීම්** | **4** | | | | | |
| රථවාහන රක්ෂණය | | 84,468.92 | | 270,413.02 | | 85,000.00 |
| | | **84,468.92** | | **270,413.02** | | **85,000.00** |
| | | | | | | |
| **වෙනත් ජංගම වත්කම්** | **5** | | | | | |
| කාර්ය මණ්ඩල ණය - ආපදා | | 3,316,114.45 | | 3,255,327.39 | | 3,000,000.00 |
| උත්සව අත්තිකාරම් | | - | | 10,000.00 | | 10,000.00 |
| වත්කම් ගැණුම්කරුවන්ගෙන් ලැබිය යුතු | | 3,525.00 | | 6,125.00 | | 6,125.00 |
| | | **3,319,639.45** | | **3,271,452.39** | | **3,010,000.00** |

## දේපල, පිරියත හා උපකරණ (සටහන 06)

| | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | | කාර්යාල උපකරණ | | විදුලිමය සවිකිරීම් | | පරිගණක | | මෘදුකාංග | | මෝටර් රථ | | පොත් | | වෙනත් වත්කම් | | ගොඩනැගිලි හා ව්‍යුහ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාර්තා කරන කාලය 2019.01.01 සිට 2019.12.31 දක්වා | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 |
| ආරම්භක ශේෂය | 4,884,257.49 | 4,964,689.09 | 3,156,548.80 | 3,315,328.99 | 14,579 | 66,135.25 | 5,669,589.72 | 5,683,496.72 | 1,189,566.61 | 776,556.61 | 15,007,442.85 | 14,200,000.00 | 117,024.54 | 83,779.34 | 1,103,102.30 | 1,015,778.30 | 6,531,265.68 | 6,531,265.68 |
| එකතු කිරීම් | - | - | - | - | - | - | - | - | - | 65,000.00 | - | 807,442.85 | 1,500.00 | 33,245.20 | - | 219,900.00 | - | - |
| ගැලපීම් | - | (80,431.60) | - | (142,780.19) | - | (44,056.25) | - | (13,907.00) | - | 348,010.00 | - | - | - | - | - | (132,576.00) | - | - |
| බැහැරකිරීම් | - | - | - | (16,000.00) | - | (7,500.00) | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අවසාන ශේෂය | 4,884,257.49 | 4,884,257.49 | 3,156,548.80 | 3,156,548.80 | 14,579 | 14,579.00 | 5,669,589.72 | 5,669,589.72 | 1,189,566.61 | 1,189566.61 | 15,007,442.85 | 15,007,442.85 | 118,524.54 | 117,024.54 | 1,103,102.3 | 1,103,102.30 | 6,531,265.68 | 6,531,265.68 - |
| සමුච්චිත ක්ෂයකිරීම (වසර ආරම්භයේදී) | 1,682,637.45 | 1,251,204.40 | 1,979,099.57 | 1,769,551.78) | 11,663.2 | 36,157.93 | 4,570,167.57 | 3,583,133.49 | 864,913.28 | 776,556.61 | 10,556,893.63 | 7,713,388.12 | 36,748.45 | 28,411.47 | 652,240.83 | 615,818.88 | 656,705.34 | 330,142.06 |
| ගැලපීම | | (59,323.88) | | (108,592.50) | - | (19,910.53) | | (8,876.00) | - | - | - | - | - | - | - | (62,009.00) | - | - |
| ක්ෂයකිරීම (මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය පරිදි) | 498,550.09 | 490,756.93 | 314,055.53 | 326,940.29 | 2,915.80 | 2,915.80 | 263,305.00 | 995,910.08 | 103,252.50 | 88,356.67 | 3,001,488.57 | 2,843,505.51 | 10,684.70 | 8,336.98 | 103,412.23 | 98,430.95 | 326,563.28 | 326,563.28 |
| අඩුකළා බැහැරකිරීම මත සමුච්චිත ක්ෂයකිරීම | - | - | | (8,800.00) | - | (7,500.00) | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණන වත්කම් මත සමුච්චිත ක්ෂය කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අවසාන ශේෂය | 2,181,187.54 | 1,682,637.45 | 2,293,155.10 | 1,979,099.57 | 14,579 | 11,663.20 | 4,833,472.57 | 4,570,167.57 | 968,165.78 | 864,913.28 | 13,558,382.20 | 10,556,893.63 | 47,433.15 | 36,748.45 | 755,653.06 | 652,240.83 | 983,268.62 | 656,705.34 |
| ශුද්ධ ධාරණ අගය | 2,703,069.95 | 3,201,620.04 | 863,393.70 | 1,177,449.23 | - | 2,915.80 | 836,117.15 | 1,099,422.15 | 324,653.33 | 324,653.33 | 1,449,060.65 | 4,450,549.22 | 71,091.39 | 80,276.09 | 347,449.24 | 450,861.47 | 5,547,997.06 | 5,874,560.34 |

| | සටහන | 2020 | | 2019 | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| **<u>ගෙවිය යුතු</u>** | **7** | | | | | |
| පාරිතෝෂික | | 242,287.50 | | 250,000.00 | | 200,000.00 |
| ගොඩනැගිලි සහ ආකෘති ලීමා ආයතනයේ රඳවා තබා ගැනීම් | | 445,837.28 | | 445,837.28 | | 445,837.28 |
| දුරකථන | | 21,138.38 | | 34,266.30 | | 22,000.00 |
| අන්තර්ජාලය | | 41,070.00 | | - | | 42,000.00 |
| විශේෂඥ දත්ත බැංකුව | | 1,640.00 | | - | | 2,000.00 |
| සනිපාරක්ෂක හා ආරක්ෂක | | 155,403.53 | | 170,237.00 | | 200,000.00 |
| වැටුප් | | 8,000.00 | | 80,000.00 | | - |
| අතිකාල | | - | | 7,788.76 | | - |
| ගමන් | | 28,600.00 | | 350.00 | | 29,000.00 |
| විදුලිය සහ ජලය | | 42,579.15 | | 64,800.00 | | 60,000.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | | 28,500.00 | | 36,936.00 | | 30,000.00 |
| MCDP වැඩසටහන | | - | | 27,600.00 | | - |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | | - | | 17,079.33 | | - |
| මානව ප්‍රාග්ධන සහරාව | | 20,925.00 | | - | | 25,000.00 |
| සංඛ්‍යාන අත්පොත | | 68,705.00 | | - | | 70,000.00 |
| කොවිඩ් -19 | | 264,470.00 | | - | | 265,000.00 |
| රැකියා අරුණ වැඩසටහන | | - | | 23,167.23 | | - |
| මෝටර් රථ අළුත්වැඩියා සහ නඩත්තුව | | 250,282.53 | | 4,720.00 | | 300,000.00 |
| අනිකුත් | | 54,000.00 | | 32,550.75 | | 60,000.00 |
| සීවරයින්ගේ වාරකන් කාලය සඳහා වැඩසටහන | | | | 1,750.00 | | - |
| සම්මන්ත්‍රණ සහ වැඩමුළු | | 34,500.00 | | 22,000.00 | | 35,000.00 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල පරිභෝජන ද්‍රව්‍ය | | 9,020.00 | | | | 10,000.00 |
| මුද්දර ගාස්තු | | 1,525.00 | | 1,600.00 | | 1,725.00 |
| | | **1,718,483.37** | | **970,682.65** | | **1,797,562.28** |
| | | | | | | |
| **<u>කෙටි-කාලීන වෙන්කිරීම්</u>** | **8** | | | | | |
| විගණන ගාස්තුව – 2014 | | 81,580.00 | | 81,580.00 | | 81,580.00 |
| විගණන ගාස්තුව – 2017 | | 192,600.00 | | 221,490.00 | | 221,490.00 |
| විගණන ගාස්තුව – 2018 | | 252,000.00 | | 272,160.00 | | 272,160.00 |
| විගණන ගාස්තුව - 2019 | | 275,000.00 | | 275,000.00 | | 275,000.00 |
| විගණන ගාස්තුව – 2020 | | 275,000.00 | | - | | - |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම - එන්.බෝපගේ | | 40,062.82 | | 40,062.82 | | - |
| | | **1,116,242.82** | | **890,292.82** | | **850,230.00** |

| | *සටහන* | **2020** | | **2019** | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| සේවක ප්‍රතිලාභ | 9 | | | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 3,621,267.50 | | 3,323,854.88 | | 3,000,000.00 |
| | | | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 21,897,323.00 | | 23,408,216.00 | | 21,900,000.00 |
| | | | | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | | | | | |
| රජයේ ප්‍රදාන - සංවර්ධන කටයුතු | | 1,149,949.66 | | 6,775,338.37 | | 8,000,000.00 |
| විලම්භිත ප්‍රදාන | | 1,650,050.34 | | 5,181,716.49 | | - |
| | | 2,800,000.00 | | 11,957,054.86 | | 8,000,000.00 |
| | | | | | | |
| විදේශීය පුහුණු වැඩසටහන් මත ලාභය (අලාභය) | 12 | 981,600.00 | | (671,900.07) | | - |
| | | | | | | |
| වත්කම් බැහැර කිරීම මත ලාභය (අලාභය) | 13 | - | | (2,740.00) | | - |
| | | | | | | |
| වෙනත් ආදායම් | 14 | | | | | |
| විවිධ ආදායම් | | 56,459.97 | | 372,255.35 | | - |
| ආපදා ණය පොළි | | 112,136.56 | | 129,504.85 | | - |
| | | **168,596.53** | | **501,760.20** | | - |
| පඩිනඩි, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 15 | | | | | |
| වැටුප් හා පඩිනඩි | | 12,476,965.16 | | 11,805,466.18 | | 12,335,000.00 |
| වැඩ බැලීමේ වැටුප් | | | | 16,286.55 | | - |
| ජීවන වියදම් දීමනාව | | 2,230,800.00 | | 2,334,428.57 | | 2,230,800.00 |
| දුරකථන දීමනාව | | 87,000.00 | | - | | - |
| ගැලපුම් දීමනාව | | - | | 177,633.00 | | - |
| ප්‍රවාහන දීමනාව | | 600,000.00 | | 600,000.00 | | 600,000.00 |
| ඉන්ධන දීමනාව | | 341,815.00 | | 436,755.00 | | 342,000.00 |
| සේ.අ.අ | | 1,762,210.86 | | 1,639,516.67 | | 1,999,340.00 |
| සේ.හා.අ | | 440,552.71 | | 409,789.53 | | 440,550.00 |
| අතීකාල | | 132,719.81 | | 223,761.47 | | 132,720.00 |
| නිවාඩු දින ගෙවීම් | | 8,591.25 | | 5,013.40 | | 8,592.00 |
| වෘත්තීය දීමනාව | | 374,000.00 | | 339,519.04 | | 374,000.00 |
| පාරිතෝෂික වියදම් | | 539,700.12 | | 919,607.88 | | - |
| | | **18,994,355.02** | | **18,907,777.29** | | **18,463,002.00** |

| | සටහන | 2020 | | 2019 | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| **ප්‍රදාන හා අනෙකුත් මාරුකිරීම් ගෙවීම** | **16** | | | | | |
| පුවත් ලිපිය | | - | | 207,853.00 | | - |
| dialog TVET සඳහා පහසුකම් සැපයීම | | - | | 167,773.08 | | |
| මානව ප්‍රාග්ධන ප්‍රධානය | | 450.00 | | 17,906.77 | | |
| නිපුණතා රාමුව ක්‍රියාත්මක කිරීම | | - | | 530,476.47 | | |
| මා.ස.සං.ශ්‍රී.ජා.සභාවේ කාර්ය මණ්ඩල අංශ ශක්තිමත් කිරීම | | 39,884.76 | | 176,843.82 | | 2,000,000.00 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කමිටු නිර්දේශය | | - | | 98,472.80 | | - |
| සංඛ්‍යාන අත්පොත | | 68,705.00 | | - | | 80,000.00 |
| දේශන මාලාව | | - | | 301,006.00 | | - |
| අධ්‍යක්ෂවරුන්ගේ අත්පොත (KPMG) | | - | | 54,578.24 | | - |
| ISO | | - | | 7,600.00 | | 500,000.00 |
| වාර්ෂික පුහුණු පරතරය | | - | | 31,050.00 | | - |
| රැකියා අරුණ | | - | | 1,971,464.23 | | - |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | | - | | 1,207,894.45 | | - |
| මානව ප්‍රාග්ධන සඟරාව | | 20,925.00 | | - | | 200,000.00 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | 500,784.90 | | 523,740.12 | | 400,000.00 |
| කොවිඩ්-19 | | 286,720.00 | | - | | 100,000.00 |
| සම්මන්ත්‍රණ වැඩමුළුව | | 34,500.00 | | 692,664.19 | | 200,000.00 |
| ධීවර වාරකන් සමය | | - | | 408,803.06 | | - |
| කම්කරු ප්‍රතිසංස්කරණ | | - | | 177,124.00 | | - |
| උපදේශනයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ධාරිතාව | | - | | 185,188.14 | | - |
| කම්කරු සංක්‍රමණය | | - | | 14,900.00 | | - |
| ප්‍රකාශන | | 50,000.00 | | - | | 160,000.00 |
| විශේෂඥ දත්ත බැංකුව | | 147,980.00 | | | | 150,000.00 |
| | | **1,149,949.66** | | **9,048,188.32** | | **18,670,000.00** |

| | සටහන | 2020 | | 2019 | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| සැපයීම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 17 | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | (63,923.32) | | 154,317.98 | | 35,650.00 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | | 211,090.00 | | 518,939.73 | | 552,910.00 |
| | | **147,166.68** | | **673,257.71** | | **588,560.00** |
| ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය වියදම් | 6 | **4,624,227.70** | | **5,181,716.49** | | - |
| ගමන් වියදම්, යැපීම් හා දීමනා | 18 | | | | | |
| දේශීය ගමන් වියදම් හා යැපීම් දීමනාව | | 81,597.01 | | 34,597.20 | | 53,000.00 |
| විගණන සාමාජිකයින් සඳහා දීමනාව | | 24,000.00 | | 45,600.00 | | - |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනාව | | 184,000.00 | | 252,000.00 | | - |
| | | **289,597.01** | | **332,197.20** | | **53,000.00** |
| උපයෝගිතා සහ සේවා | 19 | | | | | |
| වරිපනම් | | 50,400.00 | | 50,400.00 | | 50,400.00 |
| විදුලිය | | 505,287.67 | | 557,384.80 | | 220,000.00 |
| ජලය | | 15,864.99 | | 25,113.40 | | 24,160.00 |
| දුරකථන ගාස්තුව හා කුලිය | | 219,803.39 | | 342,413.02 | | 220,000.00 |
| තැපැල් ගාස්තු හා ටෙලෙක්ස් ගාස්තු | | 28,995.01 | | 9,275.00 | | 30,000.00 |
| සනීපාරක්ෂක සේවය | | 550,915.93 | | 543,220.50 | | 328,420.00 |
| ආරක්ෂක සේවය | | 1,213,281.63 | | 1,617,989.74 | | 814,170.00 |
| අන්තර්ජාලය | | 150,410.00 | | 144,642.45 | | 150,000.00 |
| වෙනත් උපයෝගිතා හා වෙනත් සේවා | | 99,025.00 | | 266,590.00 | | 108,500.00 |
| | | **2,833,983.62** | | **3,557,029.81** | | **1,945,650.00** |
| නඩත්තු වියදම් | 20 | | | | | |
| මෝටර් රථ අළුත්වැඩියා සහ නඩත්තුව | | 380,618.53 | | 304,614.94 | | 339,520.00 |
| රථවාහන රක්ෂණය | | 395,123.63 | | 418,138.52 | | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා සහ නඩත්තුව | | 158,743.68 | | 172,781.74 | | 130,240.00 |
| පරිගණක අළුත්වැඩියා සහ නඩත්තුව | | 129,450.00 | | 9,600.00 | | 119,520.00 |
| වෙනත් වත්කම් අළුත්වැඩියා සහ නඩත්තුව | | 52,916.40 | | 54,605.40 | | 52,920.00 |
| ගොඩනැගිලි සහ ආකෘති අළුත්වැඩියා සහ නඩත්තුව | | 86,319.70 | | - | | 86,320.00 |
| | | **1,203,171.94** | | **959,740.60** | | **728,520.00** |
| වෙනත් වියදම් | 21 | | | | | |
| විගණක ගාස්තුව | | 225,950.00 | | 438,150.00 | | - |
| සංග්‍රහ කටයුතු | | 58275.00 | | 64,399.70 | | - |
| වෛද්‍ය වියදම් | | 15,000.00 | | - | | 15,000.00 |
| අනිකුත් වියදම් | | 85,975.00 | | - | | 24,000.00 |
| වත්කම් කපාහැරීම් | | - | | 155,039.13 | | - |
| | | **385,200.00** | | **657,588.83** | | **39,000.00** |

**සටහන අංක 12 – පැහැදිලි කිරීම්** **2020**

**ආදායම**

| | |
|---|---|
| පාඨමාලා ගාස්තුව | 0.00 |
| අඩුකළා | |

**වියදම්**

| | |
|---|---|
| ශ්‍රී ලංකා විදේශ කාර්යාංශ පාඨමාලා ගාස්තු ආපසු ගෙවීම | 600,000.00 |
| මහජන බැංකුව පාඨමාලා ගාස්තු ආපසු ගෙවීම | 300,000.00 |
| NITF | 81,600.00 |
| මුළු වියදම් | 981,600.00 |
| විදේශ පුහුණු වැඩසටහනේ අතිරික්තය (හිඟය) | (981,600.00) |

## 12. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන්

**1.** 1997 අංක 18 දරණ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාවට පැවරී ඇති බලය යටතේ මානව සම්පත් සංවර්ධනයට අදාළ සියලුම ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය දෙමින් මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.

**2. මූල්‍ය ප්‍රකාශ නිකුත්කිරීම සඳහා ගිණුම් පවත්වා ගැනීම සහ බලයදීම**

මූල්‍ය පනතේ (1971 අංක 38) 14 වගන්තිය අනුව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව රාජ්‍ය ආයතනයක් ලෙස, එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී සභාව විසින් එම වර්ෂය තුළ එහි බලතල කර්තව්‍ය සහ රාජකාරි සහ එහි ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විසර්ජනය සහ කාර්ය සාධනය පිළිබඳව වාර්තාවක් සකස් කරයි. එම වාර්තාව මඟින් අදාළ අමාත්‍යවරයා විසින් වර්ෂය තුළ සභාව වෙත ලබා දෙන ඕනෑම විධානයක් දක්වා ඇත. එකී වාර්තාවේ පිටපත් අදාළ අමාත්‍යාංශයට සහ මුදල් අමාත්‍යාංශයට (නියමිත අමාත්‍යාංශය නොවේනම්), සැලසුම් කිරීමේ අමාත්‍යාංශයට හා විගණකාධිපති වෙත එම වසර අවසාන වී මාස හතරක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය පනතේ (1971 අංක 38) 14 වගන්තිය අනුව,එක් එක් මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ආයතනයක ගිණුම් එම වසර අවසාන වීමෙන් පසු මාස හතරක් ඇතුළත විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කිරීමේදී ඔහු විසින් නියම කරනු ලබන ආකාරයෙන් ගිණුම් පිළිබඳ වාර්තා ද ඉදිරිපත් කළ යුතුය. මෙම උප වගන්තියේ දක්වා ඇති විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූල වීමට නොහැකිවන යම් ආයතනයක් මෙම පනත යටතේ වැරදිකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ කෙටි පරීක්ෂණයකින් පසු වැරදිකරු කිරීම මත රුපියල් දහස නොඉක්මවන දඩයකට යටත් කරනු ලැබේ.

**3. අනුකූලතා ප්‍රකාශය**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලබයි.

**4. ඇගයීමේ පදනම්**

ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, විදුලිමය සවිකිරීම් හා උපකරණ, පරිගණක, මෝටර් රථ සහ අනෙකුත් වත්කම් සඳහා පිලිවෙලින් ශ්‍රී ලංකාවේ තක්සේරු දෙපාර්තමේන්තුව සහ ස්වාධීන තක්සේරුකරුවන් විසින් 2008, 2011, 2014 සහ 2016 වසර තුළ සිදුකරන ලද ප්‍රත්‍යාගණනය සඳහා හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පරිවර්තනය යටතේ සකස් කෙරේ.

**5. වත්කම් ඇගයීමේ පදනම්**

**5.1** දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට/වටිනාකමට සඳහන් කරනු ලබයි.

**5.2** සියලුම දේපල, පිරියත හා උපකරණ සඳහා වියදම් කිරීමට සිදුවන කාලීන අයකිරීම් මඟින් ස්ථාවර වත්කම්වල තක්සේරු කළ ඵලදායි ජීව කාලය පුරා ඒවායේ පිරිවැය ක්‍රමානුකූලව බෙදී යන පරිදි අයකරනු ලැබේ.

**5.3** මිලදීගත් වසර තුළ කිසිදු ක්ෂයකිරීමක් වෙන් කරනු නොලබන අතර 2009 වසරට පෙර මිලදිගත් වත්කම් සඳහා බැහැර කරන වසර තුළ සම්පූර්ණ වසරේ ක්ෂයකිරීම වෙන් කරන අතර 2009 සිට ඉදිරියට එක් එක් වත්කම් මිලදි ගත් දිනය/බැහැරකරන දිනය මත පදනම් වී ක්ෂයකිරීම ගණනය කරනු ලැබේ.

**5.4** පරිභෝජන භාණ්ඩ තොග පිරිවැයේ අවමයට හා ශුද්ධ උපලබ්ධිකළ හැකි වටිනාකමට අගයනු ලබයි.

**6. ක්ෂයකිරීම**

වත්කම් පන්ති හා ක්ෂයකිරීමේ අනුපාත පහත පරිදි වේ. වත්කම් පන්ති ඒවායේ ස්වභාවය හා ආයතනය විසින් ඒවායේ භාවිතය අනුව තීරණය කෙරේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහ | 5% |
| ලිබඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| විදුලිමය සවිකිරීම් හා උපකරණ | 20% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 25% |
| මෝටර් වාහන | 20% |
| පොත් | 10% |
| වෙනත් වත්කම් | 10% |

**7. වාර්තාකරන දිනයෙන් පසු සිදුවීම්**

සියලුම වැදගත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලනු ලබන අතර අනාවරණය කළ යුතු සුදුසු ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකරනු ලැබ ඇත. පරිශ්‍රයේ නවිකරණ කටයුතු 2017 ජනවාරි ආරම්භ කළ අතර දෙසැම්බර්වල අවසන් කරන ලදි. ලීමා ඉදිකිරීම් සමාගමට ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල ශේෂ පත්‍රය තුළ ගෙවිය යුතු වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර අනුරූප වත්කම් ගොඩනැගිලි හා ව්‍යුහ යටතේ හඳුනා ගනු ලැබීය.

**8. වත්කම් මාරු කිරීම**

ලිබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ වැනි වත්කම් හා අනෙකුත් වත්කම් නවීකරණය හේතු කොට ගෙන බැහැර කර ඇත. මෙම වත්කම් පුහුණු මධ්‍යස්ථානවල භාවිතා කිරීම සඳහා වෘත්තිය පුහුණු අධිකාරිය වෙත මාරු කර ඇත. ඉහත වත්කම් මාරුකිරීම සඳහා අවශ්‍ය අනුමැතින් අමාත්‍යාංශයෙන් ලබාගන්නා ලදි.

**9. රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය**

මහා භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සපුරාලිමට භාවිතා කෙරේ. පර්යේෂණ හා සංවර්ධන කටයුතු (NHRDC කටයුතු) සඳහා දරණ ලද මුදලක් සහ වසර තුළ අයකළ ක්ෂය කිරීමට සමාන මුදලක් ප්‍රාග්ධන වත්කම්වල ඵලදායි ජීවකාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ලෙස හඳුනාගනී.

**10. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය**

10.1 **නිර්ණය කළ දායක සැලැස්ම - සේ.අ.අ.අ- සේ.නි.භා.අ**

සේවක අර්ථසාධක අරමුදල (E.P.F) සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදල (E.T.F) සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ව්‍යවස්ථාපිත සහ රෙගුලාසි සමඟ අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ. සියලුම දායක මුදල් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදල් පනතේ නියමයන් හා රෙගුලාසි අනුව සේ.අ.අ.අ සහ සේ.නි.භා.අරමුදලට ප්‍රේෂණය කරන ලදි.

10.2 **විශ්‍රාම පාරිතෝෂික**

සියලුම සේවකයින් සඳහා ‘‘සේවක ප්‍රතිලාභ’’ පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු වන විශ්‍රාම පාරිතෝෂික සඳහා මුල්‍ය ප්‍රකාශයන් හි වෙන්කිරීම් සිදු කෙරේ. පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් ලබා නොගන්නා අතරම අයුගණකව ඇගයීම් සිදුකර නොමැත.

**11. මූල්‍ය කාර්ය සාධනය**

මෙහෙයුම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තුව තුළ දරණ ලද සියලුම පිරිවැය ආදායමට අයකරනු ලැබ ඇත. ආදායම හා වියදම්වල හිඟය/අතිරික්තය සියලුම දැනුවත් වගකීම් සහ වත්කම් ක්ෂයකිරීම සඳහා වෙන්කිරීම් සිදුකිරීමෙන් පසු ගණනය කර ඇත.

**12. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක. 02 හි 27 වගන්තියේ දක්වා ඇති පරිදි වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලබයි.

**13. අමාත්‍යාංශය විසින් වෙන් කරනු ලබන මෝටර් රථ**

වාහන අංකය WP- PD 6170 හා චැසි අංකය JNICJUD22Z0116541 දරන වාහනය 2016.02.01 දින සිට තාවකාලික පදනමක් මත අප සභාව වෙත ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් තාවකාලික පදනම මත මුදා හැර ඇත.

13.විගණන වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/D/NHRDC/1/20/21

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 දෙසැම්බර් 15 දින

සභාපති,
මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සටහන් අංක 9 අනුව ප්‍රාග්ධන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන, හිමිකම් යටතේ දක්වා වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුලදී විලම්භිත ආදායම් ලෙස හඳුනාගන්නා බව සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු. 1,650,050 ක ප්‍රාග්ධන ප්‍රදාන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් යටතේ හඳුනාගැනීම වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයට අදාල රු. 4,624,227 ක් වූ ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් විලම්භිත ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 2,974,177 ක් වැඩියෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන රු. 1,650,050 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විගණනය විසින් සිදුකල ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු දේපල පිරියත උපකරණවල පිරිවැය රු. 2,064,612 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම වර්ෂයට අදාල ක්ෂය රු. 202,801 ක් අඩුවෙන් ද සමුච්චිත ක්ෂය රු. 279,177 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ජාතික සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ජාතික සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගෙන කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ

විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ජාතික සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ජාතික සභාවේ පාලක මණ්ඩලය විසින්

නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 262 (2) හා (3) | සියළුම ගෙවීම් වවුචර්වල හා ගෙවීම් තහවුරු කරන සියලුම ලියවිලිවල "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු වුවත් තහවුරු කිරීම් ලියවිලිවල එම මුද්‍රාව යොදා නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | (i) 371(2)(ආ) ඡේදය | තත්කාර්යය අතුරු අග්‍රිම සඳහා රු. 100,000 දක්වා පමණක් අත්තිකාරම් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස එක් අවස්ථාවකදී රු. 112,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණි. |
| | (ii) 371(2)(ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවත් ඊට පටහැනි ලෙස මාස 04 සිට මාස 06 දක්වා වූ ප්‍රමාදයක් සහිතව අත්තිකාරම් පියවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ජාතික සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| | බලතල, කර්තව්‍ය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ මූලික කාර්යය සහ කර්තව්‍ය | ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එය කාලීනව සමාලෝචනය කිරීම, මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට හා රජයට උපදෙස් ලබාදීම දක්වා තිබුණද ආයතනය යාවත්කාලීන කල ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) පනතේ 16(2)ඊ වගන්තිය | මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පවත්වාගත යුතු වුවත් ආයතනය පිහිටුවා වසර 23 ක් ගත වී ඇතත් දත්ත බැංකුවක් සකස් කර නොතිබුණි. |
| (ඇ) පනතේ 16(2)(1) හි එ සහ ඒ වගන්ති | සභාවේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් විශේෂඥ කණ්ඩායම් බඳවාගැනීම සඳහා ආයතනයට බලතල ලබාදී තිබුණද 1997 සිට 2020 වර්ෂය දක්වා ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් ආයතනයේ කාර්යසාධනය හා බලතල ඉටු කිරීම සම්බන්ධයෙන් සෘජු බලපෑමක් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති